# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2020.06.23

වර්ෂ 2020 ක් වූ ජුනි මස 23 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ අඩාලව කල් තැබූ ජුනි මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
04. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
06. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
09. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
10. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
11. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
12. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
13. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
14. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
15. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
16. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
17. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
18. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
19. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
20. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි.**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද දවසේ පැවැත්වෙන්නේ 2020-06-16 දින අඩාලව කල් තබන ලද මහා සභා රැස්වීමයි.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා, ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා, ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා, ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා, ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා, ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා, ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා, ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගි වීම සිදුවිය.)

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ- නැත**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** න්‍යාය පත්‍රයට දාන්න මම යෝජනා හතරක් ඉදිරිපත් කරලා තිබුණා. ඔබතුමා යෝජනා දෙකයි න්‍යාය පත්‍රයට දාලා තිබුණේ. ඒ ප්‍රශ්නය නිරාකරණය කරගෙන යමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒකට උත්තරය ලබා දුන්නා. ඉතිහාසයේ පළවෙනි වරට තේ දළු කිලෝ එකක මිල අද රුපියල් එකසිය හතළිහයි. ඉතිහාසයේ තේ ඉන්දපු දවසේ ඉඳගෙන උපරිම මිල වැඩිවීම මේ. කාටද ඒ ගෞරවය. අනිවාර්යයෙන්ම රමේෂ් පතිරණ ගරු ඇමැතිතුමාට. එතුමා ඇමතිවරයා විදියට අද ලෝක වෙළඳපොලේ තේ දළු කිලෝ එකක මිල රුපියල් එකසිය හතළිහයයි. රුපියල් අසූවට දී ගන්න බැරි වුණා පහුගිය ආණ්ඩුවට. ඒ වගේ තත්ත්වයක් තිබුණේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපේ ඇමතිතුමාවත්, ආණ්ඩුව නිසාවත් නෙමෙයි, ලෝක වෙළඳපොලේ ඒක වුණේ. ලෝක වෙළඳපොලේ ඉල්ලුම වැඩිවීම නිසා ඒක වෙලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොන ක්‍රමයෙන් හරි මන්ත්‍රීතුමා වුණානේ. මේක මීට වැඩිය පුළුල්ව සාකච්ඡා කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා ඒක ඔය මට්ටමට ලඝු කරන්න එපා. මේක මම යෝජනා කරලා තියෙන්නේ වෙනත් අරමුණකට. මේ රජයට හරි, රමේෂ් පතිරණ ගරු ඇමතිතුමාට හරි බලපෑමක් කරන්න නෙමෙයි යෝජනා කරේ. ඔබතුමාට පැහැදිලිව ඒක තේරෙනවානේ කාටද කරේ කියලා. එතකොට අපි කියන්නේ නැහැ, ජාතික මට්ටමේ ප්‍රශ්න වුණත් මේක ඇතුළේ සාකච්ඡා කරන්න බැහැයි කියලා නැහැ. ඔබතුමාලට මෙතන සාකච්ඡා කරන්න ගොඩක් දේවල් තිබුණානේ. මෙතනට පාන් ගෙඩිය, බනිස් ගෙඩිය ඔක්කොම ගෙනල්ලා සාකච්ඡා කරන්න පුළුවන්කම තිබුණනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ මන්ත්‍රීතුමා. මේකත් සඳහන් කරන්න ඕන. කාලය කියන එක බොහොම වැදගත්. මන්ත්‍රීවරයෙකුට, දෙන්නෙකුට කාලය 90% ක් දීලා ඉතිරි මන්ත්‍රීවරුන්ට කාලය 10% ක් දෙන්න මම බැඳිලා නැහැ. ඒ හින්දා සමාන කාලයක් සියලු මන්ත්‍රීවරුන්ට ලබා දිය යුතුයි. ඔබතුමන්ලා න්‍යාය පත්‍රයට පිටින් හැම වෙලාවේම නැගිට නැගිට කතා කරනවා. එදා මන්ත්‍රීවරු 10 දෙනෙක් නැගිටලා ගියේ ඔය ප්‍රශ්නය නිසා.

(ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභාවට සහභාගී වීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔය මන්ත්‍රීවරු දහදෙනා නැගිටලා ගියේ නැහැ. එහෙම කාලය, අවස්ථාව ලැබෙන්නේ නැති ප්‍රශ්නයක් තියෙනවා නම් ඒකට එක්කෝ සභාව තීන්දුවක් අරගෙන මෙන්න මේ කාරණා කතා කරමු කියලා අපි එකඟතාවයකට එමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි විදියට න්‍යාය පත්‍රයට අදාළ කාරණා පමණයි සාකච්ඡා කරන්න පුළුවන්. අඩුපාඩුවක් වෙලා තියෙනවා නම් ප්‍රගතියේදී කතා කරන්න පුළුවන්. මෙතනදී ඔබතුමා කරන්නේ මතුවෙන හැමදේකටම කතා කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ සභා වාර්තාව අරගෙන බැලුවම පේනවා ඔබතුමා කොයි තරම් කඩාකප්පල් කරලා තියෙනවාද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කරේ මට පැවරී ඇති බලතල අනුව.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක වැරදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක සභාවට අවශ්‍ය කාරණාවක් නෙමෙයි. මම උත්තරයක් දුන්නා දැන්. ඔබතුමා දැන් එන්නේ එදා තත්ත්වයටමද, මට තියෙන බලතල අනුව මේක සභාවේ සාකච්ඡා නොකළ යුතුයි කියලා මම තීරණය කරා. ඒ අනුව මෙම යෝජනා දෙක අයින් කළා. මම කිවුවා ලිඛිතව දැනුම් දෙන්න කියලා. ඔබතුමා දන්නේ නැත්නම් මම නැවත කියන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම රීති දන්නවා. ඕකම තමයි මගේ ගාවත් තියෙන්නේ. මගේ ගාවත් තියෙනවා රීති පොත. ප්‍රශ්නය තියෙන්නේ ඒක නෙමෙයි. ඔබතුමා මේකට ප්‍රවිශ්ට වෙන විදිය, මේකට මැදිහත් වෙන විදිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක අහන්නකෝ, දන්නේ නැත්නම් ඔබතුමාට මම වචනයෙන් වචනය කියන්නද, මේක අදත් අවුල් කරන්නද හදන්නේ. පොඩ්ඩක් ඉන්න කියන්න. “යෝජනාවක් පිළිබඳ යම් දැන්වීමක් න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට පෙර සභාපතිවරයා වෙත එය ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එය රීති විරෝධී බව ඔහුගේ මතය වේ නම්, ඒ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ යුතු යැයි ඔහු විසින් නියම කර, ඒ දැන්වීම කළ සභිකයාට ඒ බව දැනුම් දීමට සැලැස්විය යුතුය.”

ඉතිං මොකක්ද එතන තියෙන ප්‍රශ්නය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපිට ප්‍රශ්නය තියෙන්නේ ඒක නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද මේකත් එක්ක මම එදා ගනිපු තීරණයේ වැරැද්ද. මම තීරණයක් ගත්තා මේක ඇතුළත් නොකළ යුතුයි කියලා. ඔබතුමාට තේරෙන්නේ නැත්නම් මන්ත්‍රීතුමා මෙන්න. මාධ්‍යවේදී මහත්වරුන් දැන ගන්න ඕන, මේක සම්පූර්ණයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ කඩාකප්පල් කිරීමේ ක්‍රියාමාර්ගයක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නෑ වැරදියි. මේ කඩාකප්පල් කරන්න ඇවිල්ලා නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක නැවත කියන්නම් ඔබතුමා දන්නේ නැත්නම්. මොකක්ද මේකේ තියෙන වැරැද්ද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාගේ නොදැනුවත්කම.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඔහොම කරන්න එපා සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අදත් කරන්න දෙන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නෑ. නෑ. සභාපතිතුමා මෙහෙම කරන්න එපා. සභාව ගෙනියන්න ඕන. මේක විසඳගෙන ඕන යන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි කරන්නේ කඩා කප්පල් කිරීමක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකෙ ඉවරයක් නැහැනේ. මම පුන පුනා නැවත කියනවා එදා කියපු දේ අදත්. දැන් පේන්නේ නැද්ද තුන්දෙනෙක් නැගිටලා කෑ ගහනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා විනාඩියක් ඇහුම්කන් දෙන්න. විනාඩියක් ඇහුම්කන් දීලා උත්තර දෙන්න.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** දෙන්නෙක් නැගිටලා කතා කරන්නේ නැතුව එක්කෙනෙක් නැගිටලා කතා කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එක්කෙනයි කතා කරේ.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** දෙන්නෙක් නැගිටලා මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක සභාපතිතුමා ඔබතුමා පාලනය කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි කියන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා ඔහොම තීන්දු ගන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අහන්නේ මෙච්චරයි. මට ඒ තීන්දුව ගන්න බැරිද, එහෙම නම් මම මෙතන ඉන්න එකේ තේරුම මොකක්ද, මට න්‍යාය පත්‍රයක් අරගෙන සභාවක් කරන්න බැරිනම් ඇති වැඩේ මොකක්ද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා මේකේ අයිතිකාරයා නෙමෙයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට කවුද සභාපති, එහෙම නම් ඔබතුමාද,

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා නෙමෙයිනේ මේකේ අයිතිකාරයා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එහෙම නම් ඔබතුමාද මේකේ අයිතිකාරයා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඔබතුමා ඉන්නේ මෙහෙයවන්න විතරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එහෙම නම් මොකටද රීතිවලින් සභාපතිතුමාට බලය දෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඒක කියලා දෙන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** රීතිවලින් බලය දීලා තියෙන්නේ යම් යම් සීමාවල් වලට. ඔබතුමාට කැමති එකයි අකමැති එකයි එහෙම කරන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මම කියන්නේ මේක බොරුද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඕක බොරු නෙමෙයි. ඕක තෝරලා දෙන්න අපිටත් ඉඩක් දෙන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඕක හරි. අපිට තියෙන ප්‍රශ්නය මේවාට මුවා වෙලා තමන්ට කැමති දේ අකමැති දේ තීරණය කරන්න බැහැ. එහෙම බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මම එහෙම කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** එහෙම කරන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මම ඒක කරනවා. මට තියෙන බලය අනුව මම ඒක කරනවා. න්‍යාය පත්‍රයට යන්න. දැන් සභාව කරගෙන යන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** සභාපතිතුමා, මේක විසඳගෙන යමු අපි. ඔබතුමාගේ ඒකාධිපති ගතිය පැත්තකට දාලා කතා කරන්න ඉඩ දීලා යමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** විශේෂ කරුණුවලදී මම වෙලාව දෙන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** කතාකරන්න හම්බවුණේ නැති මන්ත්‍රීවරු ඉන්නවා කියනවානේ. එතුමන්ලා ඇති තරම් අද කතා කරන්න. අපි බලන් ඉන්නම්. අපිට මේක පැහැදිලි කරලා දෙන්න.

ගරු සභපතිතුමා අපිට මේ සභාව කඩාකප්පල් කිරීමේ කිසිම වුවමනාවක් නැහැ. හැබැයි ඔබතුමා උත්තර නොදුන්නත් කමක් නැහැ. හෘද සාක්ෂියක් තියෙනවා හැම සභිකයෙකුටම, සභාපතිතුමාට, මේ ඉන්න නිලධාරීන්ට, මාධ්‍යවේදීන්ට. ඇත්තටම ඔබතුමා ඇහුම්කන් දීලා කතා කරන්න. අපිට බාධා කරන්නේ නැතුව කතා කරන්න. මේ යෝජනාවේ ඇත්තටම මොකක්ද තියෙන වැරැද්ද. මේකෙන් එන්නේ ඒ ඇමතිවරයාට තව හයියක් කොහේ හරි විරෝධතාවයක් තියෙනවා නම්. ඒ විතරක් නෙමෙයි එතුමාට ගෞරවයක් එනවා. මේ ගෙනාවේ ඉතාම හොඳ යෝජනාවක්. ඊළඟට ඉන්ධන පිළිබඳව කියන්නම්. ඉන්ධන පිළිබඳව විවිධ මත තියෙනවා. මගෙත් තියෙනවා වෙනත් මතයක්. ඒ මතයවත් මට කියාගන්න හම්බවුණේ නැහැ. නමුත් එකක් තියෙන්නේ ජාතික තලයේ තියෙන දේවල් පවා ප්‍රාදේශීය සභාවක කතා කරන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, මේ යෝජනා එනකොට ඒවා උඩට ගලා ගෙන යනවා පිරමීඩයක් වගේ. එතකොට තමයි ඒ කරන්න ඕන දේ පිළිබඳව ජනතා මතය හරියට එන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඕන තරම් සාකච්ඡා කරලා තියෙනවා ඒවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමාට මම තව එකක් කියන්නම්. ඔබතුමාලා මේ ප්‍රකාශ කරන්නේ මේවා නොදැන. මෙහෙම එකකුත් තියෙනවා. දන්නවාද ඔබතුමා.

"දැන්වීමක් කරනු ලබන සෑම යෝජනාවක්ම, ප්‍රාදේශීය සභාවේ කටයුතු පරිපාලනය කෙරෙහි බලපාන යම් ප්‍රශ්නයකට අදාළ විය යුතුයි."

පාර්ලිමේන්තුවේ කතා කරන්න ඕන ජනතාවට ඉන්ධන සහනය ලබා දෙන එක. පාර්ලිමේන්තුවේ කතා කරන්න ඕන දෙයක් අපේ සභාවේ න්‍යාය පත්‍රයට දාගෙන කතා කරන්න පුළුවන්ද, නිකං අපි කතා කරන වෙලාවක යම් මතයක් ප්‍රකාශ කරන එක වෙනම දෙයක්. සභාවේ න්‍යාය පත්‍රයට දාගෙන ලෝකයේ බොර තෙල් මිල අඩු වුණ එක සාකච්ඡා කරන්න බැහැ. ජනතා විමුක්ති පෙරමුණ විදියට පාර්ලිමේන්තුවට ගේන්න ඕන දේවල් මේ. ඔබතුමන්ලාගේ නියෝජිතයෙක් එන්නෙත් නෑ ඉදිරියේදී පාර්ලිමේන්තුවට. එතකොට ප්‍රාදේශීය සභාවේ විතරයි කතා කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක ජනතාව තීරණය කරාවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ අබේසේකර මන්ත්‍රීතුමා මේක අවුල් කරන්න එපා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අවුල් කරන්නේ නැහැ. ඔබතුමායි ඒකාධිපති අපි නෙමෙයි. මටත් ඉඩ දෙන්න මේක තෝරලා දෙන්න. පැහැදිලි කරන්න අවස්ථාවක් ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං මන්ත්‍රීතුමා මම නැවත කියන්නම්.

"දැන්වීමක් කරනු ලබන සෑම යෝජනාවක්ම, ප්‍රාදේශීය සභාවේ කටයුතු පරිපාලනය කෙරෙහි බලපාන යම් ප්‍රශ්නයකට අදාළ විය යුතුයි."

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක බලපාන්නේ නැද්ද අපිට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමද මේක මෙතනට බලපාන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇයි ඒක බලපාන්නේ නැද්ද, මහජන සුභ සිද්ධිය සඳහා ඕන යෝජනාවක් සභාවට ගේන්න පුළුවන් තේරුණාද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විකාරද, දැන් පැහැදිලි කරා මදිද, තව යන්න ඕනද, අදත් සභාව යන්න ඕන නැද්ද,

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තව යන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එදත් ඔබතුමන්ලා දෙන්නා ඔය විදියටම නැගිටලා කතා කරා. අද සභාව යන්න ඕනද, එපාද,

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** යන්න ඕන අපි ඉන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දැන් දීපු උත්තරය තමයි තව දහ පාරක් කතා කරත් දෙන්න තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා ඇහුම්කන් දෙන්න. ඔබතුමා ඒ යෝජනා දෙක අයින් කරා. ඔබතුමා ඒ යෝජනා දෙක අයින් කරේ මේ මේ හේතු මත කියලා එදා පහදලා දුන්නද මෙතනදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම පහදලා දුන්නනේ. ඔබතුමා කතා කරපු දේවත් දන්නේ නැහැ. මම පහදලා දුන්නනේ. පනත පෙන්වලානේ පහදලා දුන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මහජන සුභ සිද්ධිය උදෙසා ඕන යෝජනාවක් ගේන්න පුළුවන්. ඒක ජාතික තලයේ තියෙන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අදත්, හෙටත්, තව මම ඉන්නකම් යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්නේ සභාවේ පරිපාලනයට අදාළ වෙන දේවල් විතරයි ඕන කෙනෙක්ගේ. පක්ෂ විපක්ෂ සියලු මන්ත්‍රීවරුන්ට මම කියනවා එහෙම නොකරපු එකේ වැරැද්ද තමයි මෙතෙක් කල් වුණේ. මම සභාපතිධූරයේ ඉන්නකම් ප්‍රාදේශීය සභාවේ පරිපාලනයට අදාළ යෝජනා විතරයි ඇතුළත් කරන්නේ. අනිවාර්යයෙන්ම න්‍යාය පත්‍රයට දුරකථන ඇමතුම්වලින් දෙන යෝජනා දාන්න බැහැ. කරුණාකරලා ලිඛිතව දෙන්න ඕන. ඒ ලිඛිතව දෙන එක මට දීලා මගේ අනුමැතියෙන් තමයි දාන්න ඕන ඊළඟ සභාවේ ඉඳගෙන. මම මෙතෙක් ඒක කරේ නැහැ. නමුත් ඉදිරියට අනිවාර්යයෙන්ම කරනවා. පක්ෂ විපක්ෂ සියලුදෙනාට ඔය විදියට ක්‍රියාත්මක කරන්නේ. කට්ටියට ඕනවට වඩා බුරුල දුන්නම, ඕන විදියට මනුස්සකම් කරන්න ගියාම එන්නේ ඔය තත්ත්වයට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක කරන්න. ඒක ගැටලුවක් නැහැ. අපි ඒක කරන්න එපා කියලා නෙමෙයි කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි මන්ත්‍රීතුමා සමාවෙන්න ඕන. මගෙන් වැරැද්දක් වුණානම් සමාවෙන්න. ඉදිරියේදී කරන්නේ ඒ විදියට. මට ඒක කරගෙන යන්න ඉඩ දෙන්න. සමාවෙන්න මගෙන් වැරැද්දක් වුණානම්. බෝපෙ පෝද්දල ජනතාව වෙනුවෙන් මට සභාව කරගෙන යන්න දෙන්න කරුණාකරලා. දැන් දීපු උත්තර ඇතිනේ. හැම එකටම දිගින් දිගට බාධා කරන්න එපා මන්ත්‍රීතුමා. තමන්ට අදාළ කාරණයට විතරක් නැගිටලා තමන්ගේ මතය ඒ අදාළ කාරණයට ප්‍රකාශ කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා න්‍යාය පත්‍රයට යෝජනා නොදාපු එක මට අදාළ නැද්ද, යෝජනා දාපු නැති කාරණය මට අදාළ නැද්ද, මම නෙමෙයිද එතකොට කතා කරන්න ඕන. ඔබතුමා ඒක පිළිගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒක පිළිගන්නේ නැහැ. මම පිළිගන්නේ මට ඒ අයිතිය තියෙනවා. සභාවේ පරිපාලනයට අදාළ දේවල් විතරයි න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න පුළුවන්. වෙනම කතා කරන්න පුළුවන්. න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න පුළුවන් සභාවේ පරිපාලන කටයුතු වලට අදාළ දේවල් විතරයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අත්තනෝමතික විදියට කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අත්තනෝමතික නෙමෙයි. ඒක එහෙමයි. එහෙම නම් මේ රීති, පනත්, ඒවත් අත්තනෝමතික වෙන්න එපැයි ඔබතුමා කියන විදියට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** රීති දීලා තියෙන්නේ අපිව හැඩගස්ස වන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි කරුණාකරලා වාඩිවෙන්න ඔබතුමා. දැන් දීපු කාලය ඇති.

**<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** වටරක නැගෙනහිර ප්‍රජා ශාලාව සෙනසුරාදා හා ඉරිදා දිනයන්හිදී පමණක් භාවිතයට ලබා ගැනීම සඳහා වූ ගිවිසුම් කාලය වසරකින් දීර්ඝ කර ගැනීමට කරනු ලැබූ ඉල්ලීම අනුව පී. සම්පත් ඩයස් මහතා හට තවත් වසරකින් (2020-04-01 සිට 2021-03-31 දක්වා) එම ගිවිසුම දීර්ඝ කර ලබා දීමටත්, ගිවිසුම්ගත මාසික බදු මුදල රු. 2,000.00 කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** 2019-12-31 දිනට අවසන් වූ වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ පරිදි වෙන්දේසි කරන ලද ද්‍රව්‍යයන් හා විනාශ කරන ලද ද්‍රව්‍යයන් ඉන්වෙන්ට්‍රි ලේඛන, ස්ථාවර වත්කම් ලේඛන හා අබලි ලේඛනයන්ගෙන් කපා හැරීම සඳහා යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** 2020 වර්ෂයේ පැවති වෙන්දේසි දෙකේදී වෙන්දේසි නොවුන භාවිතයෙන් ඉවත් කළ ටයර් රජයේ ආයතනයක් වෙත නොමිලේ ලබාදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට හේතුව තමයි ඉතාමත්ම තුට්ටු දෙකට ඉල්ලන්නේ. ඒක හින්දා තේරුමක් නැහැ. සල්ලිවලටත් සමහර වෙලාවට ඉල්ලන්නේ නැහැ. ඊට වඩා හොඳයි රජයේ ආයතනයකට ඒවා භාර දෙන එක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මොකක්ද ආයතනය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලබුදූවේ ගොවිපල වෙත තමයි ගොඩක් වෙලාවට දෙන්න බලාපොරොත්තු වෙන්නේ. හැබැයි මෙහෙම දෙයක් තියෙනවා. මට අනිත් වාහන ගැන දැනුමක් නැහැ. මම පාවිච්චි කරන කැබ් එකේ කිලෝ මීටර් තිස්දාහක් ගියපු ගමන් ටයර් අයින් කරන්න ඕන. රජයේ නියමය තියෙන්නේ කිලෝ මීටර් තිස් දාහක් ගියපු ගමන් ටයර් අයින් කරන්න. නමුත් අපේ එක කිලෝ මීටර් හතලිස්දාහක් විතර යනවා ටයර් ඕඩර් කරලා එනකොට. නමුත් ඒවා අයින් කරන කොටත් හොඳ මට්ටමේ තියෙනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** රීපිල් කරන්නේ නැද්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** ගාල්ල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයේ නිර්දේශ පරිදි 125/ඒ, කලේගාන උතුර ග්‍රාමසේවා වසමේ අංක 25/2, වී.සී පාර, කලේගාන ලිපිනයේ පදිංචි එච්. එස්. පී. ලක්ෂ්මන් කරුණාරත්න මයාගේ ඉඩමේ වැසි ජලය බැසයාම සඳහා ක්‍රමවත් කාණු පද්ධතියක් ඉදිකර ප්‍රධාන ඇළ මාර්ගයට ජලය බැහැර කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ៖-** ගරු සභාපතිතුමා මේක අවුරුදු දහයකට ආසන්න කාලයක් තිබුණ ප්‍රශ්නයක්. මට ලක්ෂ්මන් මහත්තයත් එක්ක කිසිම තරහක් නැහැ. මේකට මට ලියුමක් දීලා තියෙනවා හය දෙනෙක් අත්සන් කරලා කොහොමවත් මේක කරනවාට කැමති නැහැ කියලා. මේක මගේ කොට්ඨාශයේ. ආපදා කළමනාකරණ ආයතනයෙන් කරපු මේ දේට මම එකඟ නැහැ. මම විරුද්ධයි. ලක්ෂ්මන් මහත්තයත් එක්ක මට ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** දැන් එතකොට මට කියන්න තිස්ස මන්ත්‍රීතුමා ඒ එක්රැස්වන ජලය කොතනටද බහින්නේ. කොතනින්ද බස්සවන්නේ කියන්නකෝ. තැනත් කියන්නකෝ. ජ්ලැන්වල නොතිබෙන්න පුළුවන්. කොහේවත් නොතිබෙන්න පුළුවන්. ඒක පහත් බිමක්. ජලය ඒකරාශී වෙනවා කියන එක පිළිගන්නවාද.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ៖-** ජලය ඒකරාශී වෙනවා කියලා මම පිළිගන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** එතකොට ඔබතුමා කියන්නේ වතුර අවුරුදු දහයක් තිස්සේ තිබුණා වගේ තවත් තියන්න ඕනද, ඔබතුමා මහජන නියෝජිතයෙක්. ඔබතුමා ප්‍රාදේශීය සභාවේ ඒ කොට්ඨාශය නියෝජනය කරමින් ඉන්න මන්ත්‍රීවරයා. අවුරුදු දහයක් තිස්සේ තියෙන ප්‍රශ්නයක් මේ. වතුර ටික ඒ විදියටම තියෙන්න ඇරලා, කුණු ගඳ ගගහා තියෙන්න ඕනද ඉතුරු ටිකත්.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ៖-** මෙහෙමයි ගරු සභාපතිතුමා. කාණුව කපන්න අනිත් අය ඉඩ දෙන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** මම යෝජනා කරන්නේ මන්ත්‍රීතුමා අඩිය අඩිය දෙපැත්තෙන් අරගෙන කරන්න. ඔය කියන ලක්ෂ්මන් මහත්තයාගෙනුයි, අමරතුංග මහත්තයාගෙනුයි අඩියයි, ඊට පස්සේ චන්දන මහත්තයාගේ පැත්තෙන් අඩියයි, අඩි දෙකක් අරගෙන අඩි දෙකක් වෙන්න කාණුවක් පිටිපස්සේ තියෙන ඇළ දක්වා කපන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ៖-** එහෙම ගන්න බැහැ. එහෙම ගත්තොත් අමරතුංග මහත්තයාලගේ කුස්සියයි, වැසිකිලියයි අහුවෙනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ៖-** ඒක එතනට ගිහිල්ලා පරීක්ෂා කරලා බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** පරීක්ෂණයක් කරා. නිර්දේශත් තියෙනවා ආපදා කළමනාකරණ එකෙන්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ៖-** ඒක අනිවාර්යයෙන්ම කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ៖-** මම විරුද්ධයි ඒකට. අපි ඇවිල්ලා තියෙන්නේ සමාජයට සේවයක් කරන්න. එතකොට අපේ තියෙන දුක්ගැනවිල්ල සභාවට ඉදිරිපත් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඕන නම් මුළු සභාවම යමු. ගිහිල්ලා ඔය කාරණාව බලමු. එතනදී මම දකින කාරණාව නම් ඕක දෙපාර්ශවයටම හොඳයි ඔය කාණුව කපලා ඔය ප්‍රශ්නය අවසන් කරන එක. මම දකින දේ ඒක. අපිට යම් යම් ප්‍රකාශ කරමින් අරයාගේ හිත හොඳ කරන්න, මෙයාගේ හිත හොඳ කරන්න කිය කිය ඉන්න පුළුවන්. ඒකනේ මේක අවුරුදු දහයක් තිස්සේ නොකෙරුනේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ៖-** අපි ඒ කාලය ඇවිල්ලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** එතකොට මේ අවුරුදු හතරත් අත අරිමු. ඒකද කියන්නේ. දැන් අවුරුදු දහයක් නොකර තිබ්ච්ච එක අපි හරි මැදිහත් වෙලා මිනිස්සුන්ගේ හිත් හදලා කරන්නේ. කාටත් ප්‍රශ්නයක් වෙන එකක් මේක. සාධාරණයි මන්ත්‍රීතුමා. දෙපැත්තෙන්ම ගන්නවා කියන එක සාධාරණයි. එතකොට සභාවේ වියදමින් ඒ කාණුව කොන්ක්‍රීට් කරලා දෙනවා. එතකොට තවත් සාධාරණයි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඒ පාරෙන් වතුර බස්සවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කීයටවත් ඒ පාරෙන් වතුර බස්සවන්න බැහැ. ආපදා කළමනාකරණ එකෙනුයි, ජනාධිපති ලේකම් එකෙනුයි ඇවිල්ලා පරීක්ෂණයක් කරලා ඒ අය අපිට යම් නිර්දේශයක් එවලා තියෙනවා. ඒ අයගේ තර්කය තමයි මන්ත්‍රීතුමා ඒකට ඒ අය මැදිහත් වෙන්න ඕන නැහැ සභාපතිවරයාට තියෙන බලතල අනුව මේක කරන්න පුළුවන් කියන එක කියන්නේ. නමුත් ඔබතුමාගේ ඔය ප්‍රශ්නය එක්ක දිගින් දිගට මම මේක ඇත්තටම කල් දමමින් හිටියේ. ඔබතුමා හින්දා ඇත්ත කතාව. ඔබතුමා ඒ කොට්ඨාශයේ මහජන නියෝජිතවරයා විදියට ඔබතුමාගේ ගෞරවය ආරක්ෂා කරන්න ඕන. දන්වලා තියෙන හැම ආයතනයක්ම කියනවා මේක ප්‍රාදේශීය සභාවට විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් කියලා. මේක ජනධිපති ලේකම් කාර්යාලයට, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට, පළාත් පාලන දෙපාර්තමේන්තුවට, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට ගියා. මේ හැම තැනටම යන්නේ මේක ප්‍රාදේශීය සභාවෙන් විසඳන්න බැහැ කියලා. ඒක මගේ දුර්වලකමක් විදියට එතකොට යන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එහෙම නම් ලක්ෂ්මන් මහත්තයාලාගේ ගෙදර ගලියක් වගේ එකක් හදලා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකත් එක නිර්දේශයක්. එයාට ගලියක් දාලා එයාගේ වතුර ටික බස්සවන්න ඕන. නමුත් පොදුවේ වහිනකොට එකතු වෙන ජලය, එතන පහත් බිමක් හින්දා වහිනකොට එකතු වෙන ජලයට මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** කොහොමත් සභාපතිතුමා පහත් තැනින්නේ ජලය බහින්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන වතුර බහින්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** එතන ගරු සභාපතිතුමා මම හිතන විදියට, මම දකින විදියට සභාව වැරැද්දක් කරලා තියෙනවා. කොට්ඨාශයේ මන්ත්‍රීවරයා ඒ අවස්ථාවට එක්ක ගෙන යන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එක්ක ගෙන ගියානේ එතුමාව.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** එහෙමනම් එතනදී ඒ තීන්දුව ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමාව මගේ වාහනයේ දාගෙනම එක්ක ගෙන ගියේ.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** එහෙමනම් ඔය තර්කය නැහැ. ඒක එතනදීම විසඳගන්න තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක හරි. අදාළ මන්ත්‍රීවරයාට මම දුරකථනයෙන් දැනුම් දීලා මෙතනට ගෙන්න ගෙන ගියේ. මමත් හිටියේ වෙන පරීක්ෂණයකට ගිහිල්ලා ආපදා කළමනාකරණ එකෙන් එන කොට. ඒ අය කලින් ඇවිත් බලලා. අපිට කිවුවේ නැහැ. එතනට ගිහිල්ලා බලලා සභාවට ආවේ. කිසි කෙනෙක්ගේ, අපේ අදහස් නැතුව ඒ අය දකින විදියට තමයි ඒ මතය මෙතන ඇවිත් ප්‍රකාශ කරේ. මම කිවුවා නැවත මාත් එක්ක යමු කියලා. මම තිස්ස මන්ත්‍රීතුමාව එක්ක ගෙන, ලේකම්තුමාව එක්ක ගෙන, තාක්ෂණ නිලධාරීව එක්ක ගෙන, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් කැඳවලා ඒ ක්ෂණයෙන්ම මම ගියේ එහෙමයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරි මේ නිර්දේශය පිළිගන්නවානේ. කාටත් සාධාරණයක් කරන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට මට සභා සම්මතයක් අවශ්‍යයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කලින් ගෙනාව ප්‍රශ්නයක් මේක. ඔබතුමා කිවුවා මාසයක් ඇතුළත මේකට මම මැදිහත් වෙනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තිස්ස මන්ත්‍රීතුමා අපිට මේක කරන්න බැරිද,

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** මම මේක කරන්න දෙන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එහෙමනම් මෙහෙම කරමු. අද සභාව ඉවර වෙලා මන්ත්‍රීවරු ඔක්කොම යමු ඒක බලන්න. මොකද අවුරුදු දහයක් තිස්සේ තිබිච්ච ප්‍රශ්නයක්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** අපි කවුරු ගියත් කාටත් පේන්නේ ඕක නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා :-** මේක ඔබතුමාගේ යෝජනාවක් නෙමෙයිනේ. ඔබතුමා කියනවා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙනුයි, ජනාධිපති ලේකම් කාර්යාලයෙනුයි ඇවිල්ලා දාපු නිර්දේශයක් කියලා. සභාපතිතුමාට බලතල තියෙනවා. මේක ඇත්තටම ජනතාවට හානිකර දෙයක් නම් සභා යෝජනාව ස්ථිර කරලා තියෙනවා. ඔබතුමා තවත් මාස ගණන් බලාගෙන ඉන්න ඕන නෑ ඒක ක්‍රියාත්මක කරන්න මහජනතාවට හානියක් වෙනවා නම්. දැන් මෙතුමා ප්‍රකාශ කර ගෙන නැගිට්ටේ මහජනතාවට සේවයක් කරන්න එයා ආවා කියලා. ගමේ කොට්ඨාශයේ තමන්ගේ හිතවත් මිනිස්සුන්ට වෙනයි, අනිත් මිනිස්සුන්ට වෙනයි ප්‍රශ්නයක් නැද්ද.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** ඔබතුමා ඒක දන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා :-** වහාම ඒක ක්‍රියාත්මක කරන්න. ඒ යෝජනාවට සියලු මන්ත්‍රීවරු එකඟයි. බලන්න දෙයක් නැහැ. අපේ සභාවට නිර්ණායක එවලා තියෙනවා. අපි දීපුවා නෙමෙයි මේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා :-** නිර්ණායක එවලා තියෙනවා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන්. ඔබතුමාලා ඒවා පිළිගන්නේ නැහැ. රජයෙන් දෙන ඉහළ නියෝගයක්වත් ඔබතුමාලා පිළිගන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා :-** ඔබතුමන්ලා නීතිවිරෝධී විදියට සභාවේ යෝජනා ගේන්නේ එහෙමනම්.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** විරෝධතා තියෙනවා මෙතන. ගෙවල් හතක් විරුද්ධ වෙනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා :-** සභාව තීන්දුවක් අරගන්නකෝ. එක එක්කෙනාගේ විරෝධතා ගේන්න එපා මෙතනට. මහජනතාවට හොඳ දෙයක්නේ මේ කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ආයේ හැරෙන්න ඕන නැහැ. ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මේක තේරුම් ගන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** තේරුම් අරන් ඉන්නේ ගරු මන්ත්‍රීතුමා. මේකට හත් දෙනෙක් විරුද්ධ වෙලා තියෙනවා. මෙන්න ඒක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඒ විරෝධතාවය නිවැරදි කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මම නැවත අහන්නම් ඕන නම්. තිස්ස මන්ත්‍රීතුමා මට කියන්න. එතන ජලය බැහැලා යන්නේ කොහෙන්ද,

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** මේක පොඩ්ඩක් කියවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔය කෙනෙක් දීපු ලියුමක්නේ. අපි බැලුවානේ. ඔය මිනිස්සු දීපු ලියුමක්නේ. මම කියන්නේ වැසිකිළිවලට වෙනම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු දම්මවලා ක්‍රියාමාර්ග ගන්න එක වෙනම දෙයක්. මම අහන්නේ ඉතුරු වැහි ජලය බස්සවන්නේ කොහෙන්ද, වැසිකිළිවල කොන්ක්‍රීට් කරාට පස්සේ එතනට හාරනවා නම් ඒකට විරුද්ධව ක්‍රියාමාර්ග ගමු. ඒක වෙන කතාවක්. මම අහන්නේ එතන දැනට එක්රැස්වන මඩ සහිත ඒ වතුර ටික එහාපැත්තේ පෙනි පෙනී තියෙන ඇළට ඒ වතුර ටික සභාවෙන් කාණුවක් කොන්ක්‍රීට් කරලා බස්සවන්න බැරි ඇයි. වෙන කොහාටද ඒක බස්සවන්නේ. මට කියන්න වෙන වතුර බස්සවන්න තැනක්. සභා තීන්දුවක් ගන්න ඕන. තිස්ස මන්ත්‍රීතුමාගේ විරෝධතාවය සඳහන් කර ගන්න.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා :-** දිනයක් දෙන්න. එදාට අපි ගිහින් බලමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මම ඒ අවස්ථාවත් දෙනවා. මන්ත්‍රීවරු පුද්ගලික වශයෙන් හරි කොහොම හරි ගිහින් බලලා ලබන සභාවේ ඒ සඳහා තීන්දුවක් ගන්නවා. මෙහෙමනේ අබේසේකර මන්ත්‍රීතුමා ඔබතුමා මට කියාවි මේක. බොර දියේ මාලු බාන්න පුළුවන් මෙතනදී. මටත් කොට්ඨාශයේ මන්ත්‍රීවරයා කියන දේ අහන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔය දේට අපිත් විරුද්ධ වෙන්නද ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විරුද්ධ වෙන්න නෙමෙයි, ඔබතුමාලා කියන්නේ මේක මෙතනින්ම ක්‍රියාත්මක කරන්න කියලා. එතකොට මම කොට්ඨාශයේ මන්ත්‍රීවරයාගේ දේ ඇහුවේ නැහැ වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔය පුටුවේ ඔබතුමා වාඩුවුණේ අපක්ෂපාතීව තීන්දු තීරණ ගන්නවා කියලා පොරොන්දු දීලා. එතකොට දැන් ඔබතුමා ඔය පුටුවෙම වාඩි වෙලා මගේ කොට්ඨාශයේ මට ඕන දෙයක් කරනවා කියනවා. එහෙම කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම යෝජනාව දැම්මා. අදාළ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා ඒකට විරෝධතා එකතු කළා ඕක කරන්න එපා කියලා. නමුත් මම තීරණයක් ගන්න ඕන හින්දා යෝජනාව දැම්මා. නමුත් මට තේරෙනවා අනිත් මන්ත්‍රීවරුන් ඉල්ලීමක් කරනවා. එතුමාගේ විරෝධතාවය එක්ක අනිත් මන්ත්‍රීවරුන් ඉල්ලීමක් කරනවා මේ පිළිබඳව අපිට බලන්න ඕන කියලා. අවුරුදු දහයක් තිබුණ එක මට මාසයක් තියන්න බැරි කමක් නෑනේ. ඒක හින්දා මම මේ යෝජනාව සංශෝධනය කරලා ඊළඟ සභාවේදී තීන්දුවක් ගන්න දාමු.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** දැන් නිකං කිවුවොත් මන්ත්‍රීවරු ඉල්ලන් කනවා මේක බලන්න ගිහිල්ලා. මට තේරෙනවා ඒක. නැවත මේක බලන්න ගියාම වෙන තීන්දුව මට තේරෙනවා. එතකොට තිස්ස මන්ත්‍රීතුමාට කියන්න වෙන්නේ මොකක්ද දන්නවද "අනේ මන්ත්‍රීතුමා මේක දෙන්න වෙනවානේ. නැත්නම් හරි නෑනේ. අපිත් මෙතන ඇවිල්ලා වැරදිකාරයෝ වෙනවානේ." ඇත්ත කතාව ඒකනේ මන්ත්‍රීතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ප්‍රශ්නය තවත් දුරට තියාගෙන යන්න බැහැ. දෙකෙන් එකක් විසඳුමක් දෙන්න මොකක් හරි. මම කියන්නේ එච්චරයි. මම තිස්ස මන්ත්‍රීතුමාටත් කියන්නේ එච්චරයි. ඒ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න. මාසයයි යන්න පුළුවන්. ලබන සභාව වෙනකොට මොකක් හරි තීන්දුවක් අර ගන්න ඕන. එතන වතුර රැස් කරලා තියන්න මට බැහැ. මොකද මට හැල්ලුවට පත් වෙන්න බැහැ සභාපතිවරයා විදියට. පළාත් පාලන කොමසාරිස් කියන්නේ මගේ අකාර්යක්ෂමතාවය කියලා. තිස්ස මන්ත්‍රීතුමාගේ කියලා කියන්නේ නැහැනේ. ඩෙංගු රෝගියෙකුත් වාර්තා වෙලා තියෙනවා ඔතනින්. ඒක දන්නවාද, ඒක සුවිශේෂයි. එම යෝජනාවට සංශෝධනයක් මම එකතු කරනවා.

125/A, කලේගාන උතුර ග්‍රාම සේවා වසමේ, අංක 25/2, වී.සී. පාර, කලේගාන ලිපිනයේ පදිංචි එච්. එස්. පී. කරුණාරත්න මයාගේ ඉඩමේ වැසි ජලය බැස යාම සඳහා ක්‍රමවත් කාණු පද්ධතියක් ඉදිකර ප්‍රධාන ඇළ මාර්ගයට ජලය බැහැර කිරීමට ඇති හැකියාව පිළිබඳව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කොට ඉදිරි සභාවේදී තීරණයක් ගන්නා ලෙස එම යෝජනාවට මම සංශෝධනයක් එකතු කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම සංශෝධනය මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ අවසන් තීන්දුව ලබන සභා වාරයේදී ගන්නවා.

එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** මීපාවල, ග්‍රීන්වීච් වෙන්දේසි ඉඩමේ සභාව සතු භූමියේ මාර්ග සීමාවන්ට බැහැරව අවහිරතාවයන් ඇති නොවන පරිදි ඉදිකර ඇති බුදු මැදුර සඳහා බුදු පිළිමයක් වඩමවා පුද පූජා කටයුතු පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපිට හම්බවෙච්ච සභා භූමියේද,

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** කොහෙද මේ මීපාවල.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලද්දුහෙට්ටි වත්ත

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එතන බුදුපිළිමයක් තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම හිතන්නේ ඒ අය බුදු මැදුරක් ඉදිකරලා බුදු පිළිමය වඩම්මවන්න ගිහින් තමයි නැවැත්තුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභා භූමිය නම් ඒක පොදු කටයුතු වලට තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරි නිර්දේශය තියෙනවා. ‘‘මෙම ස්ථානය පරීක්ෂා කළෙමි. මාර්ග සීමාවෙන් බැහැරව අවහිරතාවයක් ඇති නොවන පරිදි ඉදිකිරීම් කර ඇත. නිර්දේශ කිරීම සුදුසුයි.’’

**ගරු මන්ත්‍රී ජේ.ජී. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එතකොට සභාපතිතුමා අපේ සභා භූමියනේ. අපෙන් ඉල්ලීමක් කරලා, අපි අනුමත කරාට පස්සෙද ඉදිකිරීම කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙනවා. ඒකත් මම කියන්නම්. ගමේ ඔක්කොම එකතු වෙලා තියෙනවා මේකට. මේක මට ග්‍රාම නිලධාරි තමයි වාර්තා කරේ. ඒ අය ඉදිකිරීම කරලා තියෙන්නේ. ඒක මම වහාම නැවැත්තුවා. ඒ අය වඩම්මවන්න දිනයකුත් ලේස්ති කරලා තිබුණේ. චමින්ද මන්ත්‍රීතුමා මොකක්ද දන්නේ නැහැ මේ ප්‍රශ්නය.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒක මම දැනුවත්ව රජයේ ඉඩමක් නෙමෙයි. පාරට තියෙන ලොකු කොටසක්. පර්චස් ගාණකින් වෙන් කරපු කොටසක් නෙමෙයි. පොදු කටයුත්තකට කියලා වෙන් කරපු කොටසක් නෙමෙයි. ඉඩම් කැබලි කරද්දි යම් යම් ප්‍රමාණ අයින් වෙනවානේ පාරටත් එක්ක. එහෙම කොටසක්. සභාවට වෙන් කරලා දීපු කොටසක් නෙමෙයි. රිසවේෂන් කොටසක් වගේ. මගේ නම් විරෝධතාවයක් නැහැ. මගේ කොටසට තමයි අයිති වෙන්නේ. මම දන්නෙත් හදලා ඉවර වුණාට පස්සේ තමයි. මම ඒ පැත්තට යැවෙන්නෙත් නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ලස්සන බුදු පිළිමයක් තියෙනවානේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒක තිබුණා කියලා ඒ මිනිස්සුන්ගේ අවශ්‍යතාවය ඉටු කර ගන්න ඒ කන්දට නගින්න බැරුව ඇතිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා ඕතන නෙමෙයි කොහේ හැදුවත් විරුද්ධයි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එතුමාගේ විරෝධතාවය කොහොමත් තියෙනවානේ. මගේ එහෙම එකක් නැහැ. සභාව ඒ තීරණය ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරි නිර්දේශය තියෙනවානේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගයාන් මන්ත්‍රීතුමා සභා ගර්භයේ නැති නිසා කවුරුහරි ඒ වෙනුවෙන් යෝජනා ටික ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** එතුමා මෙතන නැති නිසා මම මේ යෝජනා ටික ඉදිරිපත් කරන්නම්.

**06.** හිරිඹුරගම ප්‍රජාශාලාව ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ- 07.** දකුණු පළාත් සභාව සතු ගොඩකන්ද - හෝඑවාගොඩ මාර්ගයේ හා ලබුදූව - කරාපිටිය මාර්ගයේ දෙපස තණකොළ වැවීම නිසා කාණු පද්ධතිය අවහිරවීමෙන් මාර්ගය භාවිතා කරන්නන් දුෂ්කරතාවයට පත්ව ඇත. ඩෙංගු උවදුර බහුල වශයෙන් පවතින ප්‍රදේශයක් බැවින් කඩිනමින් මෙම මාර්ගයන් දෙපස පිරිසිදු කරන ලෙස දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ- 08.** බද්දේගම මාර්ගයේ දෙණියවත්ත අතුරු මාර්ගය, ගොඩකන්ද ගුරුදේවල වත්ත මාර්ගය, ගැමුණු මාවතේ ගුණසේකර මහතාගේ නිවස අසළ හා

රුක්මන් මහතාගේ නිවස අසළ සිලින්ඩර් යොදා රැඳී ඇති ජලය බැසයාමට සැලැස්වීම සඳහා යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ- 09.** ගොඩකන්ද - ගොඩකන්දවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ- 10.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කැලි කසළ, සත්ව ආහාර අපද්‍රව්‍ය මාර්ගයට හා සුසාන භූමි ඇතුළු පොදු ස්ථානවලට බැහැර කිරීම නිසා ජනතාව මහත් අසීරුතාවයට ලක්වීම වැළැක්වීමට සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස යෝජනා කරමි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒක මන්ත්‍රීතුමා ඔබතුමා කියන එක හරි. විශේෂයෙන්ම බෝපෙ, වැලිපිටිමෝදර ඔය හරියේ දිගටම සභාවේ බැකෝ යන්ත්‍රය යවලා මේවා වැළලීම් කටයුතු සිද්ධ කරා. තව පාරක් තිබුණා ඒකෙදි නම් මම කිව්වා අපිට කරන්න දෙයක් නැහැ කියලා. අපෙන් දිගින් දිගටම බලාපොරොත්තු වෙන්න එපා කියලා. පළවෙනි පාර පොලීසියත් එක්ක එකඟතාවයකට ඇවිල්ලා CCTV චෙක් කරනවා කියලා මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා එක්කත් කතා කරලා තමයි වැළලුවේ. දෙවැනි සැරේ කතා කරාම මම කිව්වා මට නම් කරන්න දෙයක් නැහැ ඔයගොල්ලන්ගේ මට්ටමින් ක්‍රියාත්මක කරන්න කියලා. නමුත් ඊයෙත් ආවා පොලීසියෙන්. අපි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයයි, පොලීසියයි ඒකරාශී වෙලා ඕකට වැඩ පිළිවෙලක් හදන්න සාකච්ඡා කරලා තියෙන්නේ. පොලීසිය කියන්නේ මහජනතාව තොරතුරු ලබා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඒකේ අසීරුතාවයට ඔබතුමාට ඉස්සෙල්ලා මම පත්වෙනවා. මම පත්වුණාට පස්සේ තමයි ඔබතුමන්ලා පත් වෙන්නේ. නගරාධිපතිතුමා, ලේකම්තුමා සියලුදෙනාම පත් වෙන්නේ ඊට පස්සේ. මොකද, පමණක් වෙලාවට මේක යද්දි මන්ත්‍රීතුමා මොනවද මේ ගඳ, ඔබතුමාට මේවා උහුලන්න පුළුවන්ද කියලා අහන තත්ත්වයට පත් වෙලා තියෙනවා. මේක අද ඊයේ ප්‍රශ්නයක් නෙමෙයි. මේ කාරණාව පහුගිය කාලවල් වල තිබුණ නිසා මම යෝජනා කළා CCTV කැමරාවක්, දෙකක් අරගෙන අපි අදාළ තැන්වල සවිකරමු කියලා. අපිට ඊට මුරකරන්න බැහැනේ. දැන් මේකෙදී ඇත්ත වශයෙන්ම කියනවා නම් වෙන්න ගියේ විශාල හානියක්. ගෝරියක් යන්න ගියේ. මොකද අර කැලි කසළ දාන්නේ හඳුන්වත්ත සුසාන භූමියකට. ඒක කලින් පෞද්ගලික ඉඩමක්. ඒක වැකුණගොඩ කට්ටියක් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට දීලා තියෙන්නේ. ඒ අයගේ ඉඩමට තමයි දැම්මේ. නමුත් අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අයත් ඒකේ භූමදානය කරනවා. ඉතිං එතනදී ඒ ගමේ ඉන්න මිනිස්සුන්ට මුස්ලිම් මිනිස්සු කරන ජරා වැඩක් මේ. ඒ අය කිව්වා මේක අපි ගිහින් දාමු කියලා පල්ලිය ඉස්සරහ. පල්ලිය ඉස්සරහ ගෙනිහින් දැම්මා නම් ලොකු නරක තත්ත්වයකට යනවා. ඊට පස්සේ තමයි පොලීසිය ඇවිල්ලා මේකට මැදිහත් වෙලා සාකච්ඡා කරලා, වෙනත් අය දැම්මා කිව්වම මේ තත්ත්වයට පත් වුණේ. ඉතිං මේ ප්‍රශ්නයේදී මම කියන්නේ අපි පාරවල් හදන එකයි, වීදි ලාම්පු හදන එකයි, කැලි කසළ අයින් කරන එකයි තමයි මේ ප්‍රාදේශීය සභාව විශේෂයෙන්ම කරන්නේ. ඊට පස්සේ මරණයට පත් වෙන අයගේ භූමදාන කටයුතු සිදු කිරීම සහ ඒ අදාළ කටයුතු තමයි අපිට තියෙන්නේ. ඉතිං මේකට දැන් ප්‍රධාන තැනක් දෙන්න ඕන. ඇත්තටම මේකට ලොකු ගාණක් වියදම් වෙන්නේ නැහැ. ඒ කැමරා හයිකරාම හොර රහසේ අපිට චෙක් කරන්න පුළුවන්. මේක අදටත් සිද්ධ වෙනවා. මේක වහාම නවත්වන්න ඕන. නැවැත්තුවේ නැතිවුණොත් ඊළඟට මට ඒ ගම්වල අය යෝජනාවක් කරා. මේක කරන්නේ පල්ලියේ තමයි. කුකුල්ලු මරන්නේ පල්ලියේ තමයි. ඒ කුකුල් අපද්‍රව්‍ය ගෝනි වලට දාලා පල්ලියෙන් තමයි මේක පිටකරන්නේ කියලා කිව්වා. සභාව විදියට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු සමඟ එතනට ගිහිල්ලා ඒ අයව දැනුවත් කරන්න මේ වැඩේ කරන්න එපා කියලා. අපිට දැනුවත් කරන්න පුළුවන්. හැබැයි ඒක කරන කොට සභාවක් විදියට අපි එහෙම නම් ඒ කුකුල් අපද්‍රව්‍ය දාන්න සභා බලප්‍රදේශයේ ස්ථානයක් තෝරලා දෙන්න ඕන මේවා වළදාන්න හරි. ඒක දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි වළදාන්න දෙන්නේ මොකටද.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා :-** ඒ අයත් ජනතාවනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මොකක්ද කියලා මට තේරුනේ නැහැ. අපි වළදාන්න දෙන්නේ මොකටද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඒ අපද්‍රව්‍ය දාන්න තැනක් තියෙන්න ඕන.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා :-** ඒක නැති නිසානේ පාරේ දාන්නේ. පාරේ දාන්නේ නැති වෙන්න බෝපෙ පෝද්දල බලප්‍රදේශය තුළ ස්ථානයක් දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒ අයගේ ව්‍යාපාර ලියාපදිංචි කරන කොට මස් මැරීමට ගන්න ඕන හරක් මැරීමට ගන්නවා වගේ. මස් මැරීමට ගන්න ඕන.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා :-** හොඳ තැනකට ආවා. අපි සාකච්ඡා කරලා තීන්දුවක් ගමු. මේ ප්‍රශ්නය අපිට බලපාන ප්‍රශ්නයක් නේ. මේක නාවින්නෙත් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** නෑ මන්ත්‍රීතුමා. මම මේක පැහැදිලි කරන්නම්. දැන් පහුගිය දවසේ නාවින්න ප්‍රදේශයේ ඔය ප්‍රශ්නය ඇවිල්ලා මමයි, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමයි ගෙයින් ගෙට ගියා ඔය මස් මරන අයගේ. ඒකේ නිර්දේශයක් තියෙනවා තමන් ඒ කුකුල්ලු මරණවා නම් ඒකේ සියලුම අපද්‍රව්‍ය බැහැර කරන්න. ඒ අයගේ වැඩපිළිවෙලක් තියෙන්න ඕන. අපි දෙන්න ඕන නැහැ. ඒවා දාන්නේ කොහොමද කියලා ඒ අයගේ වැඩපිළිවෙලක් තියෙන්න ඕන. එයින් හතරකට අපි නඩු දැම්මා. ඒකට අදාළ ව්‍යාපාරය කරනවා නම් ඒක ඒ අය කරන්න ඕන. ඒ අයගේ ඉඩමේ ඒ පහසුකම තියෙන්න ඕන.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා :-** ඒක හරි සභාපතිතුමා. ඒකට මොකක් හරි වැඩපිළිවෙලක් තියෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** අපේ කසළ එකතු කරන අයවත් ඒවා ගන්නේ නැද්ද, දුප්පත් මිනිස්සුනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අබේසේකර මන්ත්‍රීතුමා ඒක උත්තරයක් නෙමෙයිනේ. දුප්පත් මිනිස්සුද, පොහොසත් මිනිස්සුද කියලා නෙමෙයි. ව්‍යාපාරයක් කරනවා නම් ඒ ව්‍යාපාරයට අදාළ පසුබිම තමන් නිර්මාණය කර ගන්න ඕන. අපිට ඒකට කියන්න බැහැ මෙයාට පර්චස් පහයි තියෙන්නේ කියලා. ඒක දැනගෙන තමයි තමන් ව්‍යාපාරය කරන්න ඕන. ඒක නිදහසට කාරණයක් නෙමෙයිනේ. අපිට තියෙන්නේ පර්චස් දෙකයි. මේක කරන්න විදියක් නැහැ කියන එක නිදහසට කාරණයක් නෙමෙයි. එහෙම නම් එයා බද්දට හරි කොහේ හරි තැනකින් අරගෙන ඒ ව්‍යාපාරය හරි විදියට කරන්න ඕන.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා :-** හැබැයි ඒ වගේම තවත් අවධානය යොමු කරන්න ඕන කුකුල් මස් විකිණීමේ කඩ ගැන. දැන් ඉදිරියේදී බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කඩ ලියාපදිංචි කරනවද දන්නේ නැහැ. ඒ ගැන පරීක්ෂාවට ලක් වෙන්න ඕන. මට ආරංචි මාර්ගයකින් දැන ගන්න ලැබුණා දැන් එහෙම මස් කඩයකට අනුමැතිය ඉල්ලනවා කියලා. ඒ අනුමැතිය ඉල්ලලා එනකොට අපිට ඒ රීති වලට යන්න සිද්ධ වෙනවා. මොකද අපිනේ මේකෙන් අපහසුතාවයට පත් වෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඒක පොඩ්ඩක් පැහැදිලි කරන්න ඕන. දැන් ඇත්තටම ගරු සභාපතිතුමා මම දන්නා තරමින් අපි කඩයක් බදු දෙනවා ඇරෙන්න ඒ අයගේ කඩයකින් අපිට ගන්න අයිතියක් නැහැ. මේක තමයි ඇත්ත නීතිමය තත්ත්වය. දැන් ඒවා ගැන කතා කරලා අපි මෝඩයෝ බවට පත් වෙන්න යන්න ඕනත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා :- 11.** මාම්පිටිය අදහන් දොළ සිට වටරක කැපූ ඇළ දක්වා සුද්ධ පවිත්‍ර කිරීම සඳහා දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත දන්වා එම කාර්යය ඉටු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා :-** මොකද මේ කාරණය කාලයක් තිස්සේ අපේ බලප්‍රදේශයේ තියෙන දෙයක්. මේකේ කලුතෙල් ගලාගෙන එනවා. අපද්‍රව්‍ය එනවා. දෙපළකින්, තුන්පළකින් වගේ එනවා. මේක දැන් නවතින්නේ නැහැ. වැස්ස වහිනකොටම සර්විස් සෙන්ටර් වලින් තමයි එන්නේ.

සර්විස් සෙන්ටර් වලින් මේක අරිනව වැස්සක් වහිනකොටම. එතකොට ඇළ කලු වෙනවා. ඒවා තැන් තැන්වල තැන්පත් වෙලා දැන් ඒ ඇළ මාර්ග පද්ධතියම නරක් වෙලා තියෙන්නේ. ජරා වෙලා තියෙන්නේ. එම නිසා මේකට ඉදිරියේදී කටයුතු කරන්න කියලා යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 12.** නරාවල, කාසල්හිල්වත්ත ක්‍රීඩා පිටිය අසළ සිට කනත්ත දක්වා ඇති මාර්ගය පළල අඩි 20ක් වුවද එම ප්‍රමාණය තත්‍ය වශයෙන් නොමැති බැවින් එම මාර්ගය මැනීම් කටයුතු සිදුකර මාර්ගයට හිමි පළල සලකුණු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දන්වා යවනවා. ඒක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තමයි කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මේක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යවන්නේ නැතුව මෙහෙට යෝජනා කරේ මේක ඉක්මනින් කෙරෙන්න ඕන කටයුත්තක් නිසා. දැනට ඒ මාර්ගය කාපට් කරන්න යෝජනා කරලා සකස් කෙරෙමින් තිබෙනවා. එතකොට ඊට කලින් මේක නීත්‍යානුකූලව පාර නියමිත පළලට සකස් කර ගන්න ඕන. ඒක තමයි සභාව මාර්ගයෙන් ඉක්මන් කරලා කරගන්න ඕන නිසා යෝජනා කරේ. සභාවෙන් ඉල්ලීමක් කරමු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මේක ඉක්මනට කරලා දෙන්න කියලා. අපි පෞද්ගලික ඉල්ලීමක් කරනවාට වඩා සභාවෙන් ඉල්ලීමක් කරොත් ඒක ඉක්මන් වෙනවා. රාජ්‍ය ආයතන දෙකක්නේ. ඒක ඉක්මනට කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ මැදිහත්වීම හා හොයා බැලීම මත තමයි මේක ඉක්මන් කර ගන්න වෙන්නේ. දන්නවානේ තත්ත්වය මොකක්ද කියලා.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඇත්තටම දන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 13.** නරාවල තුෂාර ගුණරත්න මහතාගේ නිවස දෙසට යන මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 14.** නරාවල කොට්ඨාශය සඳහා වීදි පහන් කට්ටල 50ක් අලුතෙන් මිලදීගෙන සවිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ අවුරුද්දේ විදුලියට වෙන් කරපු මුදල් ඉවරයි. යෝජනාව ස්ථිර කරලා තියමු.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 15.** කරාපිටිය පන්විලදූව වත්ත ජල මාර්ගය අවහිර කළ සියලුදෙනාට නීතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ පන්විලදූව වත්ත වෙන්දේසි කරන ලද ඉඩම නිසා ඇත්තටම ලොකු අවහිරතා තියෙනවා. නීත්‍යානුකූල නොවන වැඩ තොගයක් සිද්ධ වෙලා තියෙනවා. ඒක නිසා ඒ නීත්‍යානුකූල නැති දේවල් වලට විරුද්ධව ඔබතුමා බලලා ක්‍රියාමාර්ග ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද මේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කරාපිටියේ පන්විලදූව වත්ත. ඒ කියන්නේ එතන දැන් ඉන්න ඔක්කොම අපහසුතාවයට පත් වෙලා තියෙන්නේ අර දොස්තරගේ ඉඳලම. ඒ මිනිස්සු මේක කරපු නිසා අහිංසක මිනිස්සු දුක් විඳින්නේ සභාපතිතුමා. ඒ අයට වහාම ලියුම් යවන්න මේකට ක්‍රියාමාර්ග ගන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යවලා තියෙනවා ලියුම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 16.** කලුවාගහ අද්දර වෙන්දේසි ඉඩම සම්බන්ධව එහි විස්තරාත්මක වාර්තාවක් ලිපිගොනුව සහිතව සභාවට ඉදිරිපත් කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ මොකක්ද මන්ත්‍රීතුමා. අපිට ඒක හොයා ගන්න බැරි වුණා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කලුවගහ අද්දර කියන්නේ මදාරා එක පහුකර ගෙන ගිහිල්ලා අතන ටැක්කියවත්ත සමූපකාරය තිබුණ තැන පහුකරගෙන යන කොට කන්ද උඩ තියෙන වෙන්දේසි ඉඩම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවුරු කරපු එකක්ද,

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක මම හිතන්නේ පෞද්ගලිකව කවුරු හරි කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොයි කාලේ කරපු එකක්ද දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වෙන්දේසි කරලා දැන් වතුර පවා අරගෙන සියල්ල මේවා කරලා. බිල්ඩින් ප්ලෑන් පවා අනුමත කරනවා මේවගේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 17.** කලුවාගහ අද්දර වෙන්දේසි ඉඩම සම්බන්ධවන පී.ආර්.ඩී මාර්ගය අවහිරවීම සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක මේ පී. ආර්. ඩී. මාර්ගයට සම්බන්ධ වෙන තැන. ඔබතුමා යන්න බලන්න. මේකට මොකක් හරි ක්‍රමයක් නොහැදුවොත් ඒ පාරත් ඉවරයි. ඔක්කොම ඉවර වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 18.** නීතිවිරෝධි ඉදිකිරීම් සම්බන්ධ අධිකරණ ක්‍රියාමාර්ග ගතයුතු අවස්ථාවලදී නිවැරදි කිරීම් ඉදිරිපත් කිරීම හිතාමතා නඩු නිමිති පරාජය කිරීම සඳහා ගෙනයනු ලබන උපක්‍රමශීලී ක්‍රියාමාර්ගයක් වන බැවින් එවැනි දේ නොකරන ලෙස යෝජනා කරන අතර එවැනි හේතුවක් මත නඩුවක් පරාජය වුවහොත් එහි සම්පූර්ණ වගකීම සැලසුම් කමිටුව දැරිය යුතු බවට යෝජනා කරමි.

ඒ කියන්නේ මම කියපු දේ තේරෙන්න ඇතිනේ. දැන් අපි නීතිවිරෝධීව ඉදිකරලා තියෙනවානම් ගොඩනැගිල්ලක්, උදාහරණයකට කියමු දැන් මේ බිල්ඩින් එක නීතිවිරෝධියි. එතකොට දැන් ඒක ඒ අයට දෙනවා නීතියට අනුව ක්‍රියාකරන්න කියලා. නීතිවිරෝධි නම් පටන් ගන්න කොටම නවත්වන එකයි තියෙන්නේ. එහෙම පටන් ගන්න කොට නවතින්නේ නැතුව හදලා ඉවර වුණාට පස්සේ ඇතුළේ කරපු දේවල් අපි දන්නවානේ. ඒවා අරගෙන කොහෙන් හරි මේවා කරලා ශේප් කරලා වැඩේ අනුමත කරලා දෙනවා.

ඊළඟට අපි උසාවියකට ඒකට විරුද්ධව නඩු මාර්ගයකට යන්න ගියාම යන්නේ වෙන එකක්. අපි අනවසර එකක් ඉවත් කරන්න ඕන. ඒක හදන්න දෙන්නේ නැතුව නතර කරනවා ඇරෙන්න අපි කොහොමද ඒකට නඩු දාන්නේ.

ගරු සභාපතිතුමා ඔබතුමාට මම උදාහරණයක් කියන්නම්. දැන් බලන්න අර තට්ටු තුනක විතර බිල්ඩින් එකක් පෙනි පෙනී හැදුවා ඇක්සස් ඉඩමේ. ඒක තමයි උදාහරණයකට ගන්න තියෙන

හොඳම එක. මේ මාර්ගයේ කොලර් එකේ හදලා තියෙන්නේ. ඉතිං මේ වෙනකම් අඩු ගාණේ ගනිපු ක්‍රියාමාර්ගයක් නැතේ මේකට. ඔබතුමාගේ කාලයේ නෙමෙයි පටන් ගත්තේ ඒක. දැන් මේ හැම සභාවකම මේක කතා කරලා තියෙනවානේ. ගනිපු ක්‍රියාමාර්ගයක් නැහැ. ඉතිං ඒකට නඩු දාන්න ඕන. කොහොමද බැංකු ණය අරගත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක සභාව අනුමත කරපු ප්ලෑන් එකක්. එතන පොඩි වෙනසක් තියෙනවා. ඒක නිවැරදි කරන්න කල් ඉල්ලලා තියෙනවා ඒ අය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එතකොට ඒ අය අවසාන ගෙවීම්වලට යන්නේ කොහොමද, බැංකුවල ලෝන්වල හරියට කරාද කියලා දන්නවාද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනුකූලතා සහතිකය දීලා නෑ. ඒ අය ඒක නිවැරදි කරනවා කියලා අපිට ලිඛිතව දැනුම් දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ජලසම්පාදන මණ්ඩලයේත් පර්චස් එකක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒවත් අල්ලලා. ඒ සියල්ල එක්ක නිවැරදි කරන්න කියලා කියන්න. මම අහන්නේ කවදද මේක නිවැරදි වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාස හයක් කල් ඉල්ලලා තියෙනවා නිවැරදි කරන්න. පෙබරවාරි වල ඉඳන් මාස හයක් කල් ඉල්ලලා තියෙනවා. මාස හතරක් දැනට ගිහිල්ලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ජලසම්පාදන මණ්ඩලයේත් පර්චස් එකක් තියෙනවා ඒකත් අල්ලලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ ඒක අතඇරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මෙන්න මේවා ඕන සභාපතිතුමා ගිහිල්ලා පරීක්ෂා කරලා බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ මුළු සභාවටම කියන්න ඕන කාරණයක් තියෙනවා. මම ඒක ඊළඟ සභාවට තීන්දුවක් ගන්නත් දානවා. තොටගොඩ සම්පූර්ණයෙන්ම පෙනි පෙනී අනවසර ඉදිකිරීම් කරනවා. ගොවිජන සේවා කොමසාරිස් ගියාම "ඔහේ අහක බලන් යන්න, ඔහේට වැඩක් නැහැ." කියන මට්ටමේ ඉඳලා පස් දැම්මා පෙරේදා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කොතනද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තොටගොඩ දක්ෂිණපාය පහුවෙන කොට වම් අත පැත්තේ දිගටම. මට අනුමැතිය දෙන්න. ඊළඟ සභාවට දානවා. අපි, මාර්ග සංවර්ධන අධිකාරිය, ගොවිජන සේවා එක තුනම එකතු වෙලා වැඩපිළිවෙලක් හදනවා. අනිවාර්යයෙන්ම ඒ සියලු දෙනාටම නඩු දානවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තොටගොඩ ඒවට විතරක් නෙමෙයි අනිත් ඒවාටත් නඩු දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තොටගොඩ සුමිත් උප සභාපතිතුමාගේ ගෙදරට හැරෙන පාරේ වම් පැත්තේ දිගටම ඒ තියෙන අනවසර ඉදිකිරීම් ඔක්කොටම නඩු දානවා. ඊයේ පෙරේදා පස් දැම්මා පෙනි පෙනී. රමේෂ් පතිරණ ඇමතිතුමා කතා කරලා කිව්වා වහාම අත්අඩංගුවට අරගන්න කියලා. පැමිණිලි පහක් තියෙනවා. දවස් අටකට රිමාන්ඩ් කරලා දැන්. ගොවිජන කොමසාරිස් ගියපු වෙලාවේ ඉරිදා දවසේ බලහත්කාරයෙන් පස් දැම්මේ. ගොවිජන සේවා කොමසාරිස් ගියාම එයාට කියලා ඔහෙට වැඩක් නෑ මේක අපි දානවා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පොදු එකක්ද, පෞද්ගලික එකක්ද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පෞද්ගලික එකක්. එවෙලෙම රිමාන්ඩ් කරා. දැන් පැමිණිලි පහක් දාලා තියෙනවා. ක්‍රියාත්මක වුනේ නැහැ. ඉදිකිරීමක් කරලා පතුලට පස් දානවා ඊයේ පෙරේදා.

දැන් අබේසේකර මන්ත්‍රීතුමා තව එකක් තියෙනවා. ඉදිකිරීම කරද්දි අපි ගිහින් නවත්වනවා. ඒක ඇත්තටම සාකච්ඡා කරන්න ඕන කාරණයක්. අපි ටෙලිග්‍රෑම් එකක් ගහනවා. ඊට පස්සේ සභාවෙන් ලිඛිතව දැනුම් දෙනවා. දැනුම් දීලා නවත්වනවා. නමුත් ඒ නැවැත්වීම කෙසේ වෙතත් නැවත සෙනසුරාදා ඉරිදා බලලා ක්‍රියාත්මක වෙනවා. නැවත ඒක කරනවා. එතකොට අපිට පුළුවන් ඒකට පොලීසිය හරහා මැදිහත්වීමක් වෙන්න. අපිට බලහත්කාරයෙන් නැවැත්වීමේ හැකියාවක් නැහැ. අපි පොලීසිය දැනුවත් කරලා නවත්වනවා. නමුත් ඒක කරනවා. එතකොට අධිකරණ ක්‍රියාමාර්ගයකට යන්න වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පොලීසියකට සභාවෙන් කියන දේ කරන්නේ නැහැ කියන එක උඩ විතරයි ක්‍රියාමාර්ග ගන්න පුළුවන්. පොලීසියකට ඉදිකිරීමක් නතර කරන්න අයිතියක් නැහැ. මොකක් හරි සාමයක් කඩ වෙනවා කියන එක උඩ ඇරෙන්න පොලීසියකට වෙන කරන්න දෙයක් නැහැ. ඇත්තටම සභාව විසින් තමයි කරන්න ඕන එහෙම එකක් දෙකක්. අධිකරණ ක්‍රියාමාර්ග අරගෙන නතර කරන්න ඕන. එකක් දෙකක් කරානම් එතකොට ඔය ප්‍රශ්නයට විසඳුමක් එනවා. එහෙම නැති වුණාම තමයි මේ ප්‍රශ්න එන්නේ. මොකද එක්කෙනෙක් කරන කොට අනිත් මිනිහත් කරනවා. අපිට වුණත් කියන කොට සභාවට ඇවිල්ලා අපිටත් ප්‍රශ්නයක්. අතන කරනවා ඒකට මුකුත් නැහැ කියනවා. ඒක හින්දා මම කියන්නේ ඔබතුමා ගන්න කොහේ හරි එකකට දෙකකට තහනම් නියෝග. උසාවියෙන් ගත්තට පස්සෙ කාටවත් මුකුත් කරන්න බැහැ.

ගරු සභාපතිතුමා, ලීඩ්ස් එකේ එක තාම හදනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඒකට නඩු දාන්න ලේස්ති කරන්න නීතිඥතුමාට භාර දීලා තියෙන්නේ. ඒකට නඩු දාන්න දීලා තියෙන්නේ. තව නරාවල පියවරගම පාරේ දෙපැත්තේ අනවසර ඉදිකිරීම් වලට නඩු දාන්න භාර දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් අර සෙන්ට්‍රීටාස් එකට හැරෙන තැන එකට ටෙක්ලා මන්ත්‍රීතුමිය එදා ඉදිරිපත් කරා. එතන බලන් ඉන්දෙද්දිම හැදුවේ. ඔබතුමා එන පාරෙම. ඊළඟට සුභසිංහලා ඒ කාලේ ඔබතුමන්ලා අපි හැප්පිච්ච මේවා ටික. අද වෙනකොට සුභසිංහලා මුළු මේවා එකම විනාශ කරලා හදලා තියෙනවානේ. සම්පූර්ණයෙන් වෙලක් ඒක. ජල පෝෂිත ප්‍රදේශයක්. මම කියන්නේ ඒවාට ගන්න මොනවා හරි ක්‍රියාමාර්ගයක්.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා සෙන්ට්‍රීටාස් එකට හැරෙන තැන ඉදිකිරීම ගැන මම ඒ කොට්ඨාශයේ මන්ත්‍රීවරිය ලෙස හිතාගෙන තමයි මිනිස්සු මට කෝල් කරලා කිවුවේ. මම ගරු සභාපතිතුමාට ඒ ගැන කිවුවා. එතනට අපි ගිහින් බැලුවා. බලනකොට ඉතිං පාරේ ඉඳලා අඩි හැටක් තියෙනවා. සභාවෙන් අවසර දීලා තියෙනවා. මමත් ගියා. මම කොට්ඨාශයේ මන්ත්‍රීතුමිය කියලා හිතාගෙන තමයි කට්ටිය මට කෝල් කරලා කිවුවේ. මගේ කොට්ඨාශයට අයිති නැහැ. මිහිරගේ කොට්ඨාශය. මම මිහිර මහත්තයාට දැනුම් දුන්නා. එයා ගිහින් බලලා තිබුණා. එතන ප්‍රශ්නයක් නැහැ කියලා තමයි කිවුවේ. එතන තියෙන ගොඩනැගිල්ලම තමයි හදලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක සභාව අනුමත කරලා නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙනවා අබේසේකර මන්ත්‍රීතුමා. ගොඩනැගිල්ලක් තිබුණා. අසංක නම එයාගේ. ගැරිජ් එකක් තිබුණා එතන.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ගැරිජ් එක තිබුණ තැනම හදලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි අබේසේකර මන්ත්‍රීතුමා. දැන් අනවසරයි කියලා ඔබතුමා කියන එක හරි. අනවසරයි කියන කොට සභාවෙන් අවසර අරගෙන නැහැ. නමුත් අඩුම තරමේ මම දකින දේ අපි සභාව හැම එකටම අනවසරයි අනවසරයි කියලා නඩු දානවට වැඩිය සභාවට හානියක් වෙන එකකට ඕන නඩු දාන්න. ඕක තර්කයක් ගේන්න පුළුවන් මෙහෙමයි කියලා. නමුත් පාර මැද ඉඳගෙන අඩි 60 ක් තියෙනවා. ඔබතුමා කියන විදියට අපි ඒකට නඩු දාන්න ඕන අඩි 15 ක් වත් තියන්නේ නැතුව හදපු ඒවාටත් නඩු නොදා. ඔබතුමා ඉස්සෙල්ලා කියපු තර්කය දැන් තියෙන්නේ. මෙතන අඩි 60 ක් තිබිලත් අපි නඩු දාන්න ඕන. එතන තිබුණ ඉදිකිරීමක් කඩලා හදලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ඒක මගේ කොට්ඨාශයේ කියලා හිතලා තමයි මට කිවුවේ. මම සභාපතිතුමාටත් දැනුම් දුන්නා. ගිහින් බැලුවා.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

(ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා කලුවාගහ අද්දර ඉඩම වෙන්දේසි ඉඩමක් නෙමෙයි. පුද්ගලිකව බෙදාගනිපු ඉඩමක්. වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා මම කාරක සභාවක් යෝජනා කරනවා තාක්ෂණ නිලධාරී දිනූෂ මහත්තයට සභාව දැනුවත් කිරීම සඳහා.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරී දිනූෂ රත්නප්‍රිය මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- මෙම කලුවාගහ අද්දර මුළු ඉඩම අක්කර 2.5ට වැඩි බව.
- 2007 වර්ෂයේ මැයි මස මෙම ඉඩම කැබලි කර ඇති බව.
- මෙම ඉඩම හරහා ඇති මාර්ගය අඩි 15ක් බවත්, මාර්ගය අඩි 20ක් කළ යුතු බවට යූ.ඩී ක්ලියරන්ස් ලබා දී ඇති බව.
- මෙම ඉඩම අධිකරණයේ සමගි බෙදුමක් මගින් දෙකට බෙදී ඇති බවත්, එම ඉඩම් කැබලි දෙක නැවත කැබලි කර ඇති බව.
- මේ සඳහා නඩු පැවරීම සඳහා යූ.ඩී එක දැනුවත් කළ බවත්, යූ.ඩී එකේ කොළඹ කමිටුව මගින් මේ සඳහා නඩු පැවරීම සිදුකළ නොහැකි බවට දැනුවත් කළ බව.
- මුල් ඉඩම අක්කර 2.5ට වැඩි බැවින් කැබලි කරන ලද ඉඩම් අනුමත කිරීමේදී මාර්ගයට අඩි 2.5 ක් ලබා ගැනීමටත්, පොදු පහසුකම් සඳහා සැපයීම සඳහා ඉඩමේ වටිනාකමෙන් 10%ක් සභාවට ලබාගෙන නාගරික සංවර්ධන අධිකාරි ගිණුමට බැර කර එම මුදල් මෙම ඉඩමේ පොදු පහසුකම් සඳහා යොදවන ලෙස උපදෙස් ලැබුණ බව.
- මුළු ඉඩමම අනුමත කළ නොහැකි බැවින් ඉඩම් කැබැල්ලෙන් කැබැල්ල අනුමත කරන බවත්, මුළු ඉඩම් කැබලි සංඛ්‍යාව 30කට ආසන්න ප්‍රමාණයක් ඇති බව.
- මීට අමතරව මන්ත්‍රීවරුන්ට මෙම ඉඩම සම්බන්ධව ඇති ගැටළු සාකච්ඡා කරන ලදී.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 19.** රත්නගිරිවත්ත, ව්‍යාපෘති මාර්ගයේ රක්ෂිත කොටසේ පිහිටා ඇති නුග ගස අනතුරුදායක බැවින් සභා වියදමින් එම ගස කපා ඉවත්කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 20.** කිතුලම්පිටිය කොට්ඨාශයේ අඳුරු ස්ථාන ඇති මාර්ගවලට සවිකිරීම සඳහා වීදි පහන් කට්ටල 40ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රීනි එම්.ගයාත්‍රී කාංචනා මැතිණියගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රීනි එම්.ගයාත්‍රී කාංචනා මැතිණිය ඃ- 21.** කුරුන්දකන්ද ප්‍රධාන මාර්ගයේ ඩබ්. පී. මුනිදාස මහතාගේ නිවස අසළ මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රීනි එම්.ගයාත්‍රී කාංචනා මැතිණිය ඃ- 22.** බාස්වත්තේ, ඉසුරු උයනේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමාගේ යෝජනා**

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම යෝජනා හතරක් ඉදිරිපත් කරා. ඉන් දෙකක් ඔබතුමාගේ අභිමතය භාවිතා කරලා ඉවත් කරලා තියෙනවා. ඒ සම්බන්ධයෙන් මම මූලික විරෝධතාවය ප්‍රකාශ කරනවා මේ අවස්ථාවේදී පළමුවෙන්ම.

ඊළඟට මේකේ අංක 23 යෝජනාව හැටියට යෝජනා කරන්න හිටියේ නරාවල සිට්ට්‍රස් එක ඉස්සරහින් යන මාර්ගය සංවර්ධනය කරන්න. ඒකේ වැඩ ආරම්භ කරලා තිබුණා. මම මේ යෝජනාව ඉදිරිපත් කරන කොට පාර සුද්ධ කරලා තිබුණේ නැහැ. පාරේ වලවල් ගොඩක් තිබුණා යන්න බැරි තරමට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම මාර්ගය චනක මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි කාපට් කිරීමට යෝජිතයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැන් මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න බැරි වෙනවා තාවකාලික පිළිසකර කිරීම් අවශ්‍ය නැති නිසා. ඒ නිසා එම යෝජනාව මම ඉල්ලා අස්කර ගන්නවා.

**24.** අප බල ප්‍රදේශය තුළ මාර්ග දෙපස අවහිර වී ඇති කාණු පද්ධති ක්‍රමවත් කර ඉදිරි වැසි කාලයේදී වැසි ජලය එක්වීමට ඇති ඉඩකඩ වළකා ඩෙංගු වැනි වසංගත රෝග වලින් ප්‍රදේශයේ ජනතාව ආරක්ෂා කිරීමට නිසි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන මෙන් මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, මේක ඉතා බරපතල ප්‍රශ්නයක්. මම මේක ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වෛද්‍යතුමා එක්කත් සාකච්ඡා කරා. එක මොහොතකදී එතුමා කිව්වා මේ වන විට රෝගීන් කිහිපදෙනෙක් වාර්තා වෙලා තියෙනවා කියලා බලප්‍රදේශය ඇතුළේ. ඒ නිසා ඒකාබද්ධ ක්‍රියාමාර්ග ගැනීමට එතුමාලා සැලසුම් සකස් කරමින් ඉන්නවා කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ යෝජනාව හොඳයි. දැනටමත් ඒකාබද්ධ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වෙනවා. අපිට පහුගිය මාස තුනේ රැස්වෙන්න බැරිවුණා. නමුත් අපි අවුරුද්දක පමණ කාලයක ඉඳන් මාසිකව රැස්වෙනවා. ඒ අය මුලින්ම හැදුවා බෝපෙ පෝද්දල දැනට අක්‍රමවත්ව වතුර බැස යන කාණු පද්ධතිය. ඒක දැන් සකස් කරලා තියෙනවා ඒ අයගේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු යොදවලා. අපි මාසිකව රැස්වෙලා කතා කරලා අවශ්‍ය කාණු ටික සකස් කරලා තියෙනවා. ඒ ලැයිස්තුවෙන් ඒ ටික අයින් වෙනවා. ඒ වැඩ පිළිවෙල දැනටමත් ක්‍රියාත්මක වෙනවා. හැබැයි පහුගිය මාස තුනේදී බැරි වුණා. නමුත් අපේ පවිත්‍ර කටයුතු කරගෙන ගියා කමිටුව රැස්වෙන්න බැරි වුණාට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා පොඩි අවසරයක් දෙන්න. මම මේ කාරණා පැහැදිලි කරාම ඔබතුමා පැහැදිලි කරනවානම් හොඳයි කියලා හිතෙනවා. මගේ යෝජනාව ඇතුළේ තියෙන්නේ, ඔබතුමාගේ තර්කයට අනුවම කියනවා නම් මේ බලප්‍රදේශයේ සභාවේ පරිපාලන විෂය පථයට යටත් සීමාව තුළ තමයි යෝජනාව කරන්න පුළුවන්කම තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ යෝජනාව ඉතාමත්ම හොඳයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභා බලප්‍රදේශය තුළ අපිට තියෙන වපසරිය ඇතුළේ කාණු පද්ධතියට අයත් වන්නේ මාර්ග දෙපස කාණු පද්ධති තමයි. අනෙකුත් ජලය බැස යාමේ කාණු ඇළ මාර්ග සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ ගොවිජන සේවා මධ්‍යස්ථානය, කෘෂිකර්ම අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව වගේ ආයතන. ඒ නිසා අපිට සභාව සම්බන්ධ විය හැකි සීමාව ඇතුළේ ඉඳගෙන මේ යෝජනාව කරත් මම පෞද්ගලිකව දන්න දේවල් තියෙනවා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා සභාව මෙහෙයවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෙනම සභාවක් යනවා වගේ පිටිපස්සේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාව විනයක් ඇතුව හසුරුවන්න ඔබතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්දව ඉන්න. මෙතුමා අද හොඳ ප්‍රවේශයක් ගත්තානේ. වැඩිය කතා කරෙත් නැහැනේ. එතුමා කතා කරන වෙලාවේ අවස්ථාව ලබා දෙන්න. අපි ඒකට සහයෝගය දෙන්න ඕනනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ස්තූතියි ඔබතුමාට. සහයෝගය ලබා දෙන්න. මම මේ කාරණය පැහැදිලි කරාම ඔබතුමාට මේ සම්බන්ධයෙන් අදහසක් තියෙනවානම් කියන්න පුළුවන්. ගැටලුවක් නැහැ. මගේ යෝජනාවට සංශෝධනයක් හෝ වැඩිමනක් එක් කිරීමක් හෝ කරන්න ගැටළුවක් නැහැ.

මම යෝජනා කරේ මේ මොහොතේ සභාවේ වපසරියට අයත් පාර දෙපස කාණු පද්ධතිවල ජලය බැසයාමේ ක්‍රමවේදයේ අක්‍රමවත්භාවය පිළිබඳව. ඔබතුමා කිවුවා අපි පහුගිය කාලය තුළ කමිටු රැස්කරලා ක්‍රමවත් වැඩපිළිවෙලකට යනවා කියලා. මේ මාස තුනේ යන්න බැරිවුණා කිවුවා කොරෝනා තත්ත්වයත් එක්ක. නමුත් ප්‍රශ්නය තියෙන්නේ ඉස්සරහට වැසි කාලය එන්නේ. මේ කාලය ඉතාම වැදගත් මේ සම්බන්ධයෙන්. ඉස්සරහට ඩෙංගු වගේ එකක් බෝ වුණොත් ඒක අපේ බලප්‍රදේශයට හොඳත් නැහැ. සභාවක් හැටියට හොඳත් නැහැ. සභාවේ විෂය පථයට අයත් කාරණයක්. අපද්‍රව්‍ය කළමනාකරණය හා මාර්ගය දෙපස ජලය බැසයාම මේ ප්‍රශ්නය. ඒ නිසා ගරු සභාපතිතුමනි මේකේ අපි යෝජනා කරන්නේ ඒවා තියෙනවා නම් හඳුනාගත්තම වඩා පහසු වේවි ජලය බැස නොයන අක්‍රමවත් තැන් ගැන.

මෙතනදී කාරණයක් මතු වුණා බලප්‍රදේශයේ ඉඩමක් සම්බන්ධව. ලක්ෂ්මන් මහතාගේ නිවස සම්බන්ධ කාරණයට ඔබතුමා යහපත් ප්‍රවේශයක් ගත්තා. ඔබතුමා පොරොන්දු වුණා මම ඒ යෝජනාව කරන කොට. මේ සභාවට එතුමාගේ ඉල්ලීමත් දාලා මම යෝජනාවක් කරා පසුගිය සභා වාරයක. එතනදී ඔබතුමා පැහැදිලිව මට විශ්වාසයෙන් කිවුවා මාසයක් ඇතුළත මම මේ ප්‍රශ්නය විසඳනවා කියලා. නමුත් වෙනත් බාහිර පාර්ශවයන්ගේ මැදිහත්වීමත්, ඒ සියල්ල මත ඔබතුමා මේකට යම් උත්සාහයක් ගත්තා. ඒකට ඔබතුමා නිවැරදිව තේරුම් අරගෙන ඒ ප්‍රශ්නයට උත්තරයක් සපයයි කියලා මම විශ්වාස කරනවා. මේ යෝජනාවෙන් මම අදහස් කරන්නේ මේක අපේ බලප්‍රදේශයේ, අපේ විෂය පථයට අයත් කාණු විතරයි අපිට සුද්ධ කරන්න පුළුවන්කම තියෙන්නේ. නමුත් ප්‍රශ්නය තියෙන්නේ ඒ මාර්ග දෙපස කාණු යන්නේ ඇළ මාර්ග හරහා. මේ ඇළ මාර්ග පිළිසකර වෙලා නැහැ. සමහර ඒවායේ වතුර බැස යන්නේ නැහැ. නඩත්තු වෙන්නේ නැහැ. මේක බරපතල ප්‍රශ්නයක් වෙනවා. එතකොට අපි මෙහේ මාර්ග දෙපස කාණු සුද්ධ කරත්, වතුර ඇළට ගිහින් හිරවෙනවා. වතුර බැස යන්නේ නැහැ. අපිට ඒ ප්‍රමාණයට වඩා එහාට තියෙන ඇළ මාර්ග වල කටයුතු සභාවට අයත් වෙන විෂයක් නෙමෙයි. අපිට එතනදී ක්‍රියාමාර්ගයක් ගන්න සිද්ධ වෙන්නේ ඊට අදාළ බාහිර ආයතනත් එක්ක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක දීර්ඝව කතා කරන්න අවශ්‍ය වන්නේ නැහැ. ඔබතුමා නිශ්චිතව තියෙන තැන් දැනුම් දෙන්න අපිට. ඒක ප්‍රාදේශීය සභාවෙන් නම් නඩත්තු කරන්නේ ඒක ප්‍රාදේශීය සභාව හරහා හරි, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නම් ඒකට දැනුම් දීලා අපි ඒ වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන්නම්. ඔබතුමා නිශ්චිතව දෙන්න අපිට. අපි හිතනවා 50% ක් වත් කාරණාවක් මේ වෙලාවේ ඉෂ්ට කෙරෙමින් පවතිනවා කියලා. ඔබතුමාට මේ සම්බන්ධව තවත් දේවල් තියෙනවා නම් දෙන්න. දැනට ඔබතුමා දකිනවා ඇති හෝළුවාගොඩ වෙල් යායේ දෙපස තියෙන බෝක්කු දෙකට මහා ඇළවල් දෙකක් දිගටම කැපුවා. ඒ වගේම අතුරු ඇළවලුත් මේ වෙන කොට පිළිසකර කරමින් පවතිනවා. ඒ වගේම අපේ මූලික ඉලක්කයක් තියෙනවා. දැන් හෝළුවාගොඩ කුඹුරු කාලයක් තිස්සේ කරන්න බැරි වුණා. ඒක අස්වැද්දවීමේ වැඩසටහනකට ඉදිරියේදී යනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්නේ හෝළුවාගොඩ වෙල් යායේ ඇළමාර්ග හෝ කුඹුරු වැපිරවීමට නොහැකිවීම සම්බන්ධයෙන් වෙනම ගැටලුවක් තියෙනවා. ඒක ඇත්ත. නමුත් මම කරපු යෝජනාවට ඒක අදාළ වෙන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට එහෙම තියෙන තොරතුරු ටික අපිට දෙන්න. එහෙම නැත්නම් ඊළඟ සභාවේදී සභාගත කරන්න. නැත්නම් අපිට දෙන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක ලැබෙන්න සලස්වන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ලැබෙන්න සලස්සවන්න. ඒක හරි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා කලුවගහඅද්දර වෙන්දේසි ඉඩම ගැන කතා කරා. අවසානයේ සිලින්ඩරයක ප්‍රශ්නයක් ආවා. ඒකේ අවසන් තීන්දුවට මොකද වුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා එන්න කලින් අපි ඒක ගැන කතා කරා. ඔබතුමා එන්න ඉස්සෙල්ලා මතු වෙච්ච කාරණාවක්නේ. අපි තීන්දුවක් අරගෙන නැහැ. අපිට තීන්දුවක් ගන්නත් බැහැ. අධිකරණ තීන්දුවකට යන්නත් බැහැ. ඉතිං එතනදී කිවුවේ අරක තමයි. මාර්ගෝපදේශනයක් අපිට දීලා තියෙනවා. අපෙන් අවසර ඉල්ලුවොත් කවුරුහරි එතනින් එයාගේ ඉඩමෙන් අඩි දෙක හමාරක් පාරට දෙන්නත්, 10% ක් ගාස්තු ගෙවන්නත් වෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒක තමයි දැනට තියෙන මේවා එක. මම කියන්නේ සමහර මිනිස්සුන්ට පර්චස් තිහක්, හතලිහක් තියෙනවා. පර්චස් හතලිහට වැඩි නම් අරහෙන් අනුමත කරන්නේ. ඒ වගේ බිම් කැබැල්ලක් අනුමත වෙද්දි පර්චස් හතලිහෙන් එක පාර්ශවයක එක කොටසක් අනෙක් පාර්ශවයේ අනෙක් කොටස. මූලික ඉඩම අනුමත වෙන්නේ නැතුව අනුබෙදුම් අනුමත වෙන්නේ නැහැ කියලා කියනවා. එතකොට අර මනුස්සයා ගෙවල් ගානේ ගිහින් මේක අනුමත කරමු කිය කිය යන්න ඕන. කලුවගහ අද්දර නීතියම අනෙක් ඉඩම් සඳහාත් ක්‍රියාත්මක කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතන තියෙන කාරණය වෙනස්නේ මන්ත්‍රීතුමා. මේක උසාවි තීන්දුවකින් බෙදපු එකක්. සමගි බෙදුමක් ආපු එකක්. ඉතිං එතනදී නැවත අපිට අධිකරණයට යන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නමුත් පාරවල් පිළිබඳ ප්‍රශ්නය තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එක්කෙනෙක්ට මම දන්න තරමින් ලොකු බිම් කැබැල්ලක් තියෙනවා.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මේ කියන කාරණය තමයි, සාමාන්‍යයෙන් ඉඩම් අරගෙන ගොඩනැගිලි අයදුම්පතක්, ප්ලෑන් එකක් අනුමත කරද්දි මුල් ප්ලෑන් එක හොයනවා. පැටිකිරිය හොයනවා සභාවෙන්. මේකට එහෙම නැත්තේ ඇයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකට ඒවා ඕන. මේකටත් මුල් ප්ලෑන් එක ඕන. මේකේ ප්ලෑන් එක අනුමත කරත් ඊට කලින් ප්ලෑන් එක ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒකත් අනුමත කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මුල් ප්ලෑන් එක හොයනවානේ. මුල් ප්ලෑන් එක දාලා තමයි අනුමත කරන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒක ගැටළුවක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා දීපු ක්ලියරන්ස් අනුව තමයි අපි අනුමත කරන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** නාගරික සංවර්ධන අධිකාරියෙන් එක එක ඉඩම් වලට, එක එක ආයතනවලට එක එක නීති.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කතා කරලා වැඩක් නෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එක එක නිලධාරීන්ගේ හිතුමතේට වැඩ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, බෝපෙ උතුර ග්‍රාම සංවර්ධන සමිතිය ලියුමක් ඉදිරිපත් කරලා තියෙනවා ඇළබඩ සුගත් මන්ත්‍රීතුමාගේ ප්‍රදේශයේ ප්‍රශ්නයක් ගැන. අපිට පිටපතක් ලැබුණා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** අපිටත් පිටපතක් ලැබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද ඔය.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගිංගඟ මේවා එකට වැටෙන එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට අපි එයාට පහත් බිම් එකෙන් නිර්දේශයක් ගේන්න කියලා තියෙන්නේ. ගිංගඟ ලොජ් කියන එකද,

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ៖-** ඔව්. සභාවට ඉදිරිපත් කරා කිවුවා. යෝජනාව වැටිලා නෑ සභාවට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඒක ඉදිරිපත් කරේ සභාවට කියන්න නෙමෙයි. හැම එකක්ම සභාවට දාන්නේ නැහැ. සැලසුම් කමිටුවට දාලා අපි එයාට ලිඛිතව දන්වලා තියෙනවා පහත් බිම් එකෙන් නිර්දේශයක් ගේන්න කියලා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ៖-** මම හිතන්නේ අවුරුදු පහක් හයක් වෙනවා මේවා හදලා. ඒ කාලේ අනුමැතිය කවුරුහරි එක්කෝ දීලා තියෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** අනුමත කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ៖-** ඒ කාලයේ ඒවා දෙන්න ඕන. නැත්නම් ඔවා කරන්න විදියක් නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** නෑ. සභාව අනුමත කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ៖-** ඒක තමයි සභාවේ කවුරුහරි අනුමත කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** සභාව අනුමත කරලා තියෙන්නේ. අවුරුදු හයක් ද කොහෙද වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ៖-** කොහොමද එහෙම දෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඒක දීපු එකේ වරදක් නැහැ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ៖-** වතුර බහින්නේ නැතිලු. පාර යටවෙනවලු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඒක ජල පෝෂක ප්‍රදේශයක්. ඒකට උඩින් තමයි ඉදිකිරීම කරලා තියෙන්නේ. ගියාම පේනවා. සුගත් මන්ත්‍රීතුමත් දන්නවා. ඒක ගිං ගඟ අයිනේ ඉදිකරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ៖-** පහත් බිම් එකෙන් ඒකට සාධාරණයක් ඉෂ්ට කරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** මම කියන්නෙත් ඒක. දැන් අවුරුදු පහකට කලින් අනුමැතිය දීලා තියෙන්නේ. මම කියන්නේ ඒකයි. එතකොට කවුරුත් විරුද්ධ වුණේ නැහැනේ. අපි දැන් මේකට අවුරුදු පහකට පස්සේ විරුද්ධ වෙන්නේ. මට තියෙන ප්‍රශ්නය ඒකයි. අපිට කරන්න පුළුවන් දේ ඒකට කරා. අපි ඒ ගැන පරීක්ෂණයක් කරා. ජලය බැස යාමේ ක්‍රමවේදය පිළිබඳව පහත් බිම් එකෙන් නේ අපිට දෙන්න ඕන. පහත් බිම් එකෙන් අපි නිර්දේශයක් ඉල්ලුවා. ඒක ඒ අනුව ක්‍රියාත්මක කරන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. ඒ නිර්දේශය අනුව තමයි කරන්නේ. ඒක ඔබතුමා මතු කරපු එක හොඳයි. පැමිණිල්ල දාලා තියෙන්නේ අවසර දීපු එක සම්බන්ධව නෙමෙයි. වතුර බැස යාමේ ක්‍රමවේදයේ ගැටළුවක් තියෙන්නේ. ඒකට පහත් බිම් එකෙන් අපිට නිර්දේශ දුන්නට පස්සේ බලමු.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ៖-** ඒකේ වගකීමක් සභාවට එනවානේ. ඒ වගකීම තුළ අපි ඒකට සම්බන්ධ වෙලා කතා නොකරම හිතන්නේ වෙන දෙයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** අපි හිතන්නෙත් සුගත් මන්ත්‍රීතුමා ඔය ඉල්ලීම සාධාරණයි. ඒක උඩ තමයි අපි වැඩ කරන්නේ. මේක අවුරුදු පහකින් නෙමෙයි දහයකින් හරි මතුවෙන්න පුළුවන්. දැන් තමයි වතුර ප්‍රශ්නය එන්නේ. ඉස්සර නොතිබෙන්න පුළුවන්. අපිටත් කරන්න පුළුවන් දේවල් තියෙනවානේ. මේක අපි අනුමත කරපු එකක්. අපේ සභාව එන්න කලින් අනුමත කරලා තියෙන්නේ. අපිට කරන්න පුළුවන් එකම දේ එයාට පහත්බිම් එකෙන් නිර්දේශ ගේන්න කියන එක. එයා ඒ සියලු දේවල් ඉදිරිපත් කරලා අනුමත කරගෙන තියෙනවා මොන ක්‍රමයෙන් හරි. නමුත් දැන් අපි සැලසුම් කමිටුව විදියට ඉල්ලලා තියෙනවා ඒකට අපිට පහත් බිම් එකෙන් නිර්දේශයක් ගේන්න කියලා මේක හරියි කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ៖-** එහෙම කියද්දි සභාපතිතුමා, පහත් බිම් එකෙන් නිර්දේශය දෙන කොට වතුර බැස යාමේ මොනවා හරි ගැටළුවක් තියෙනවානම් මේ වෙන කොට ඒකටත් ක්‍රියාමාර්ග ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** එයා මෙතනට ආවා. ඇවිල්ලා කිවුවා ඕන දේකට ඕන වෙනස්කමක් කරන්න එකඟයි කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** සභාවක් විදියට අපි තීන්දුවක් අරගෙන තියෙනවානේ විසඳුමක් දෙන්න කියලා. නැත්නම් ඒ ගමේ මිනිස්සු වතුරට යටවෙනවා කියලානේ කියන්නේ. ඒ අය යට නොවන විදියට විසඳුමක් දුන්නම හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මමත් ගිහින් බැලුවා. ඔය කියන එක ගැන නම් මට දැනුමක් නැහැ යටවෙනවද, නැද්ද කියලා. නමුත් ඒ ඉදිකිරීම් ටික නම් පරිසරය එක්ක හොඳට ගිහිල්ලා ඒ මට්ටමේම තියෙනවා. අපිට පේනවා. අපි දන්නේ නෑ මොකක්ද කියන එක. ජල ගැල්මකදී යටවෙනවද කියලා අපිට දැනුමක් නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ජස්ටින් කන්දේ වතුර නැහැ දවස් පහක හයක ඉඳලා. රියදුරු මහත්වරු ඇවිල්ලා ගියොත් යවා ගන්න වෙන්නේ නැහැ වතුර බවුසරයක්. වතුර බවුසරයක යවන්න ක්‍රමවේදයක් හදා ගත්තා නම් හරි. දවස් හයක විතර ඉඳලා වතුර බිංදුවක්වත් නැහැ ජස්ටින් කන්දේ මිනිස්සුන්ට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වතුර බවුසරයක් යවන්න ලේස්ති කරන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒකට මොකක් හරි වැඩපිළිවෙලක් හදන්න. රියදුරු මහත්වරු ඇවිල්ලා ගියොත් යවන්න විදියක් නැහැනේ. දවස් හයක විතර ඉඳලා වතුර ඇත්තෙම නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෝටර්බෝඩ් එකට කිය කිය ඉන්නේ නැතුව අපේ තියෙන එකක් යවලා ඒක ඉවරයක් කරමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** දවස් හයක් වෙනවා දැනට. හැමදාම අපිට වතුර යවන්න බැරි නිසා ක්‍රමවේදයක් හදන්න ඒකට.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා දැන් මෙතන අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කතා වෙනවා හැමදාම. අදත් කතා වුණා. දැන් මෙතන ඉඩමේ ඉදිකිරීමක් කරලා තියෙනවා. ඒකට සභාව පැත්තෙන් ගනිපු ක්‍රියාමාර්ග මොනවද කියලා දැන ගන්න කැමතියි. සභාව වාර දෙක තුනක් කතා කරපු ප්‍රශ්නයක්. සභාව සතු ඉඩම අල්ලලා. මෙහෙන් මැනුමක් කරා කියලා අපිව දැනුවත් කරා. මේකේ වර්තමාන අලුත්ම තත්ත්වය පැහැදිලි කරන්න. දැන් ඒ සම්බන්ධව පාර්ශව දෙකක් අපිට ලිපි එවලා තියෙනවා. මම හිතන්නේ ඔබතුමාටත් එවලා ඇති. මේක අනුව දෙගොල්ලෝ කියන කාරණාවලට අපි දෙපැත්තටම එකඟයි කියන අතර හැබැයි මේ අය නිකං ඉදිකිරීමක් කරන්නේ නැහැනේ. සභාවට ප්ලෑන් එක දැම්මම සභාවේ නිලධාරීන් ගිහිල්ලා බලලා, එදා හිටපු සභාපතිවරු ඒ නිර්දේශයන් අනුව අනුමත කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මතු කරන කතාව හරි. මම හිතන්නේ ඕක සියලුදෙනාම දැනුවත් කාරණාවක්. ඒ අදාළ පාර්ශව ගිහිල්ලා සියලු දෙනා දැනුවත් කරලා තියෙනවා. මමත් කිහිපවාරයක්ම ඇවිත් හම්බවුණා. නමුත් එතන වැරැද්දක් වෙලා තියෙනවා. සභාවෙන් අනුමත කරපු ප්ලෑන් එකට නෙමෙයි ඉදිකිරීම කරලා තියෙන්නේ. ඒක ඒ අය පිළිගන්නවා. මාත් ඒක පිළිගත්තා. "අපෙන් වැරැද්දක් වෙලා ඇතෙයි", කියලා කිවුවා. කෙලින් කියන්නේ නැහැනේ. "අපෙන් වැරැද්දක් වෙලා ඇතෙයි", කියලා කිවුවා. උසාවි යන්න ඕන නැහැ. ඒ මට්ටමේ තමයි ඒ අය මාත් එක්ක සාකච්ඡා කරේ. එතන වෙලා තියෙන දේ අනුව අපේ ඉදිකිරීම කරන්න නම් මන්ත්‍රීතුමා ඔය සියලු දේවල් නිවැරදි විය යුතුයි. එක්කෙනෙක් පාරක් ඉල්ලනවා. එක්කකෙනෙක් තාප්පය කැඩෙන එක වළක්වලා ඉල්ලනවා. මම දන්නේ නැහැ, ඔය ඔක්කොම වළක්වලා අපේ ඉදිකිරීම කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒ කෙසේ වෙතත් කොට්ඨාශයේ මන්ත්‍රීවරයා සැහෙන්න කිවුවානේ ඕක හදමු කියලා. ඉතිං එතුමත් දැන් නිහඬයි. මම අහන්නේ තමන්ට අවාසිනම් නිශ්ශබ්දයි. දැන් ඉස්සෙල්ලම ගෙනාපු යෝජනාවට මෙතුමාගේ කොට්ඨාශයේ නිසා විරුද්ධයි. එහෙම බැනේ සභාවේ නීතිරීති අනුව දේවල් වෙන්න ඕන.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මට අවස්ථාව දෙන්නකෝ. මන්ත්‍රීවරයෙකුට කතා කරන්න අවස්ථාවක් නැති සභාව මේක. ඔබතුමා කාටත් ඉස්සර වෙලා පැනලා කෑ කෝ ගහනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට වගකීමක් තියෙනවානේ මන්ත්‍රීතුමා. ඔබතුමාට අවස්ථාව දුන්නානේ. මන්ත්‍රීවරයෙකුට ගෞරවයක් එන විදියට කතා කරන්න ඉස්සෙල්ලම. ඒකයි මම ඔබතුමාට කිවුවේ. ප්‍රශ්නයක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දැන් ඉවරද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉවරයි කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මේ වාර්තා අරගෙන බලන්න. රෙකෝඩින් අරගෙන බලන්න. සභාපතිතුමා ඇතුළු මේ කණ්ඩායම් පහුගිය කාලවලදී පාවිච්චි කරපු වචන බලන්න. ඒවා සභාවට ගැලපෙන වචනද, මේක අමුතු දෙයක් නෙමෙයි. ඒක සිංහල හෝඩියේ තියෙනවා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි ඔබතුමා අදහස කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මම කියන්නේ මේවා එදා කිවුවට අද එතුමත් නිහඬයිනේ. එතුමා යෝජනාව ගෙනාවා මේක අනිවාර්යයෙන්ම කරන්න ඕන කියලා. ලක්ෂ හතලිහක් එනවා කොට්ඨාශ දෙක එකතු කරලා කරන්න ඕන කිවුවා. නමුත් ඒක වුණේ නැහැ. අද නිහඬ වෙලා ඉන්නවා. ඔබතුමන්ලා මේක මේ වෙනකම්ම අරගෙන ආවා. මායිම් ලකුණු කළා කිවුවා. තව වෙනකම් උත්තරයක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇයි උත්තර නැත්තේ. ඇත්තටම ඔබතුමා දන්නේ නැති දෙයක් කතා කරන්නේ. ඔබතුමා කියන එක කිවුවට පස්සේ අපි උත්තර දෙන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** කතා කරන්න දෙන්නේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔය යෝජනාව නෙමෙයි අපි ගෙනාවේ. මේකට මැනුම් නඩුවක් දැම්මා කිවුවා. ඉඩම මැන්නා කිවුවා. ඒ උත්තරය නැති නිසානේ ඇහුවේ. මේ දෙපාර්ශවය අතර සමථයකට ගිහිල්ලානේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එහෙම දෙයක් වෙලා නෑ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔබතුමානේ නැහැයි කියන්නේ. මේ ලිඛිතව දීපුවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕන කෙනෙකුට ලිඛිතව දෙන්න පුළුවන් මන්ත්‍රීතුමා. නමුත් අපි සභාවේ එක බිම් අඟලක් අන්සතු කරන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක තමයි අපිටත් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභා භූමියේ අපිට මැනලා දීපු ප්‍රමාණයේ අපි අදාළ ඉදිකිරීම කරනවා. එතනදී ඔය පාර්ශව දෙක ඉන්නවා. ඒ පාර්ශව දෙකටම යම් සාධාරණයක් ඉල්ලනවා. එක පාර්ශවයක් ඒ ඉඩම උඩින් අවුරුදු ගාණක් ගියා කියලා පාරක් ඉල්ලනවා. අනෙක් පාර්ශවය තමන්ගේ පඩි පෙලයි තාප්පෙයි කඩන්න එපා කියලා ඉල්ලනවා. ඉතිං ඒකෙදී සභාව විදියට මම සාධාරණයක් කරන්න බලනවා. මුදලටත් ඉල්ලනවා ඒ ඉඩම් කෑල්ලෙන් කොටසක් ඒ අයට ගිහිපු ප්‍රමාණයට. ඒක අපිට කිසිසේත්ම දෙන්න හැකියාවක් නැහැ. ඒක හින්දා අපි සභාවේ දේපළ ආරක්ෂා කරනවා. අදාළ ගොඩනැගිල්ල ඉදිකරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ජනතාව කීරිගැහෙන ප්‍රශ්නයක් තියෙනවා. කරුණා අම්මාන් කියන ජන ඝාතකයා ජාතිය හෙලා දැකලා කතා කරා. රණවිරුවන් මෙච්චර මහන්සිවෙලා අරන් දීපු මේ නිදහස බාල්දු කරා. ඒ සම්බන්ධව ආණ්ඩුව මේ වෙනකම් කිසිම ප්‍රකාශයක් කරේ නැහැ. පැය හැත්තෑ දෙකකට වැඩි කාලයක් ගත වෙලා තියෙනවා. රජයෙන් මේ වෙනකම් මේකට ප්‍රකාශයක් කරලා නැහැ. අපි මේක දැඩිව හෙලා දකිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දන්නවාද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවලා එතුමාට විරුද්ධව පරීක්ෂණයක් යනවා.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** එතුමාව කැඳවලා තියෙන්නේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඕමල්පේ සෝභිත හාමුදුරුවෝ ගිහිල්ලා පැමිණිලි කරේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** පැමිණිල්ලක් කරන්නේ නැතුව කැඳවන්නේ කොහොමද.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** රජයක් විදියට වගකිව යුතු මාධ්‍ය ප්‍රකාශකවරයෙක් හරහා ප්‍රකාශයක් කළ යුතුයි. රජය ප්‍රකාශයක් කරේ නැහැ. දේශපාලන භේදයෙන් තොරව සමස්ථ ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් අප සියලු දෙනා මේ සභාවේදී මේක දැඩි පිළිකුලෙන් යුතුව හෙලා දකිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිත් පිළිකුලෙන් යුතුව හෙලා දකිනවා. ඒ යෝජනාව ස්ථිර කරනවා. ඒ වගේම හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා කරපු ප්‍රකාශය පිළිබඳවත් අපි ඉතාමත්ම කණගාටු වෙනවා. ඉතාම කණගාටුවෙන් යුතුව හෙලා දකිනවා. ඒකත් මේකට එකතු කරන්න ඕන. මේ රටේ ජාතිවාදයක්, වර්ගවාදයක්, ආගම්වාදයක් ඇති වෙන්න ගියපු එක වැළැක්වූයේ අතිගරු කාදිනල් හිමිපාණන්තුමා. උන් වහන්සේට, උන් වහන්සේගේම ආගමේ වෙච්ච කෙනෙක් ඔය වගේ පරිභව කිරීම ඇත්තටම අපි බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව විදියට තරයේ හෙලා දකිනවා ඒ එක්කම.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා දැන් මේක විෂය පථයට අදාළද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** න්‍යාය පත්‍රයට දාන්න බැහැ. මම හරියට දන්නවා ඔබතුමා ඔය වචනය කියන බව. න්‍යාය පත්‍රයට දාන්න බැහැ. ඒක වෙන කතාවක්. මම කිවුවා සභාවේ මතුවෙච්ච වෙලාවේ කතා කරන්න පුළුවන් කියලා. න්‍යාය පත්‍රයට දාන්න බැහැ. ඒක හරි. මම දන්නවා ඔබතුමා ඒක කියයි කියලා.

<u>(ඊ) කාරක සභාවල වාර්තා</u>

<u>01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-06-03 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>02. තාක්ෂණික සේවා කමිටුව</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-06-03 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව :- නැත</u>

<u>04. පරිසරය සහ පහසුකම් කමිටුව :- නැත</u>

<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම</u>

<u>01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ මැයි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ මැයි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ః-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** 2020 වර්ෂයේ මැයි මස මාසික ඒකාබද්ධ හිග ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ః-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

04. වෙනත් ලේඛන

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** I. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පීඩන වාර්තාව හා ඒ සඳහා යොමු කරනු ලැබූ පිළිතුරු

මේක සභාගත කරනවා. පරිශීලනය කරන්න පුළුවන් ඕන කෙනෙකුට.

II. නිවාඩු අනුමත කර ගැනීම. (ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා.)

කියාස් මන්ත්‍රීතුමා මෙවර පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ඉදිරිපත්වන නිසා මැතිවරණය නිමවන තුරු එතුමාගේ ඉල්ලීම පරිදි නිවාඩු අනුමත කරන්න මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ః-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** ඒ වගේම මම සුභ පතනවා එතුමාට ජයග්‍රහණය කරන්න හැකි වෙන්න කියලා ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු විදියට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ః-** මම ඒ පිළිබඳව විස්තර ඉල්ලලා ඇති තොරතුරු පනත යටතේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** කොයි පිළිබඳවද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ః-** කියාස් මන්ත්‍රීතුමා සම්බන්ධව. ඒක මට වහාම අදම ලබා දීමට කටයුතු කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** ඒක හරි ෂෝක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ః-** ඒක ගරු සභාපතිතුමා මෙහෙම තියෙන්නේ. ඇත්තටම මේක ගැන කියන්න ඕන. කියාස් මන්ත්‍රීතුමා කියන්නේ අපේ හිතවත් මන්ත්‍රීවරයෙක්. ඒක ගැන කතාවක් නැහැ. අපි හිතවත්. හෙට දවසෙත් අපි එහෙමයි. දේශපාලනයේදී එහෙම එකක් නෑ. හැබැයි එකක් තියෙනවා මැතිවරණ කොමසාරිස්තුමත් දන්නේ නැහැ සමහර දේවල් මට පේන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** මම කියන්නේ එහෙම නෙමෙයි. මට අයිතියකුත් නැහැ එහෙම අහන්න. ඔබතුමා ඒක ඉල්ලීම් කරන්නේ ඇයි. ඒක මොකටද, ඔබතුමන්ලා එකට හිටපු මන්ත්‍රීවරු. මට ඇත්තටම කණගාටුවක් ඇති වෙනවා. ඒක හැමෝටම හිතේවි. මම ගැන කවර කතාද නේද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ః-** ඔබතුමාට නම් ලොකු පාඩුවක් තියෙනවා. මොකක්ද දන්නවාද, පොඩි වොයිස්කට් එකක් අරගෙන කොන්ත්‍රාත් ටික දෙන්න ඇහැකි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** මොකක්ද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ః-** ඔබතුමා පහුගිය කාලයේ කරේ ඒකනේ. අර ලියුමට අත්සන් කරේ. පොඩි හීල කරන්න පුළුවන් කට්ටියනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** හීල වුනේ නැහැනේ. මම කිවුවේ ඒක නෙමෙයි. මම සභාපතිවරයා විදියට ඇත්තටම සුභ පැතුම් එක් කරනවා කියාස් මන්ත්‍රීතුමාට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ః-** ඉතිං මම ඉස්සෙල්ලා සුභ පැතුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් අබේසේකර මන්ත්‍රීතුමා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන් තමන් එක්ක හිටපු සහෝදරයෙක් ඒ. තමන්ගේ එක සටන් සගයෙක්. එතුමාගේ දේශපාලන ගමන පිළිබඳව එතුමා ගනිපු තීන්දුව අභියෝගයට ලක් කරන්න එපා. ඒක එතුමාගේ දේශපාලනය. නමුත් ඔබතුමාලා එක පක්ෂයේ ඉඳගෙන අද එතුමට විරුද්ධව කරන ක්‍රියාමාර්ගය කරන්න එපා. මෙතන ඉන්න සියලුදෙනාගෙන්ම මම ඉල්ලා සිටිනවා මේකට හවුල් වෙන්න එපා කියලා. ඔය වැඩේ කරන්න එපා. කාට වෙන්නෙත් ඔය වැඩේ. අබේසේකර මන්ත්‍රීතුමා එක්ක ඔය කවුරු එකට හිටියත් අන්තිමට වෙන්නේ ඔය දේ. මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා අබේසේකර මන්ත්‍රීතුමාගෙන් ඔය දේ කරන්න එපා කියලා. එතුමා නිවාඩු දැම්මේ ජුනි මාසයේ. මේ හදන්නේ එතුමා ගනිපු දීමනාව නැති කරන්න. වෙන මුකුත් නෙමෙයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා ඔක්කොම දන්නවා. ඔබතුමා මට කතා කරන්න දෙන්නේ නැහැනේ. මම කතා කරාට පස්සේ උත්තර දෙන්න. මතක තියා ගන්න එතුමා දැන් ඉන්නේ එක පක්ෂයක. මම ඉන්නේ තව පක්ෂයක. හෙට මම LTTE එකට ගියත් එතන ඉඳන් තමයි මම කතා කරන්නේ. ඒක මතක තියා ගන්න. ඔබතුමා බොහොම පැහැදිලිව ඉඳගෙන කියන්න ඕන. මම දන්නේ නෑ ඔබතුමාට මෙච්චර කේන්ති ගියේ ඇයිද කියලා. මේක දේශපාලන වැරැද්දක්. මේක දේශපාලන වශයෙන් වෙච්ච වැරැද්දක්. මේ කියාස් මන්ත්‍රීතුමයි මමයි හෙට දවසෙත් යාලුවෝ. ප්‍රශ්නයක් නැහැ. නමුත් එකක් තියෙනවා මේ පක්ෂයක් විදියට දැන ගෙන හිටියේ නැහැ නිවාඩු ලියුම ගෙන්න ගන්න ඕන කියන එක. මේ මැතිවරණ නිලධාරීන් ඉන්නවා. ඔබතුමා ඡන්දයක් ඉල්ලන කොටත් ගෙන්න ගන්නවා. මැතිවරණ කොමසාරිස් එකට දෙන්න ඕන. එතකොට නිවාඩු එක ගෙන්න ගන්න ඕනනේ. නිවාඩු අරගෙනද කියලා බලන්න ඕන. ඒවා ගැන බැලුවේ නෑ. මේ දැවැන්ත පක්ෂයක්. ඒක හින්දම තමයි කියන්නේ. ඉතිං මේ පක්ෂයේ නායකයා ගැන කතා කරන්න ඕන නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඔය පක්ෂයේ නායකයාව ගෙන්වලා ඔබතුමාලමනේ ඡන්දය දෙන්න කිවුවේ. ඔය පක්ෂයේ නායකයාටනේ ඡන්දය දෙන්න කිවුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමාට මම බොහොම කරුණාවෙන් කියනවා මම ජීවිතයේ දේශපාලන තීන්දු ගත්තා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට කියන්න අබේසේකර මන්ත්‍රීතුමා ඔය කියන නායකයාටම නේද ඔබතුමන්ලා ගිය ජනාධිපතිවරණයේදී උදවු කරේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පොඩ්ඩක් මට කතා කරන්න දෙන්න. දැන් අපිට කතා කරන්න ඉඩ දීලා කතා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මතක තියා ගන්න මේ අවුරුදු පනහක පනස්පහක දේශපාලන ජීවිතයේ මම ගනිපු දේශපාලන තීන්දු තියෙනවා. ඒවායින් මම සන්තෝෂ වෙන තීන්දුවක් තමයි, දුක්වෙන තීන්දු අතර තියෙන සන්තෝෂ වෙන එක තමයි මම මහින්ද රාජපක්ෂ මහත්තයාට ඡන්දය දීලා තමයි ආවේ මෛත්‍රීපාල සිරිසේන ගාවට. මේවා මම ප්‍රසිද්ධියේ කියන ඒවා නේ. මේවා ප්‍රසිද්ධියේත් කියනවා හම්බවුණාමත් කියනවා. මම ගැහුවේ නැහැ මෛත්‍රීපාලට ඡන්දයක්. මට ඒ ගැන සන්තෝෂය අදත් තියෙනවා. ඒ වගේම තමයි කියන්නේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අහගන්නේ නැහැනේ. කැතයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම බොහොම පැහැදිලිව කියනවා. අබේසේකර LTTE එකටද වැඩ කරන්නේ, LTTE එකේ කාර්යාලයක් ඊරියගහ හන්දියේ දානවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔන්න ඔක්කොමලා හොඳට අහගන්න. මෛත්‍රීපාල මහත්තයාට ඡන්දය දීලා නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම දුන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සජිත් මහත්තයාට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කියනකම් අහගෙන ඉන්නේ නැහැනේ. ඉවසීමක් නැහැ. මේකට නෙමෙයි මොන දේකටවත් ඉවසීමක් නැහැ. ඉවසීමක් නැතුව කරනවා හැම දේම. ගරු සභාපතිතුමා ඉවසීමෙන් අහගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අබේසේකර මන්ත්‍රීතුමා ඉවසීමෙන් කරන්න ඕන වැඩයි, ඉවසීම නැතුව කරන්න ඕන වැඩයි හොඳට දන්නවා. ඒක ඔබතුමා මට අමුතුවෙන් කියන්න ඕන නැහැ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් බලන්න ඔබතුමාමනේ බාධා කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක කියලා ඉවරයක් කරන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා හරහට මේවා දැම්මම කියන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මතක තියා ගන්න මම කාර්යාලයක් දැම්මේ නැහැ. මම රැස්වීමක කතා කරේ නැහැ. මම පෝස්ටරයක් බෙදන්න ගියේ නැහැ. මේ ඕන කෙනෙක් ඒක දන්නවා. මේ ඉන්න කට්ටියගෙන් ඕන කෙනෙක් ඒක දන්නවා. හැබැයි එකක් තියෙනවා මම වජිර අබේවර්ධන ගරු ඇමතිතුමාට කිවුවා මට කරුණාකරලා මේ දේශපාලනයෙන් සමුගන්න ඉඩ දෙන්න කියලා. මේ මනුස්සයට අද නෙමෙයි ප්‍රතිපත්තියක් විදියට මම කැමති නැහැ කියලා කිවුවා බොහොම පැහැදිලිව. මේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් අහන්න මම කිවුවද නැද්ද කියලා. ප්‍රසිද්ධියේ කිවුවේ. අනේ අබේ මේ වැඩේ කරන්න එපා කිවුවා. මේ වෙලාවේ කරොත් හොඳ නැහැ කිවුවා. ඉතිං මම හිටියා. මම ප්‍රතිපත්තියක් උඩ ඉන්නවා නම් එතනට ඡන්දය දෙනවා. ඒක මම මැරෙන මොහොතෙත් දුක් වෙනවා කියලා මම කියලා තියෙනවා. මේ සභාවේදීත් කියලා තියෙනවා. ඉතිං ඒක තමයි ඒකේ කතාව. ඉතිං ඒක උඩ මේ තියෙන්නේ වෙන දෙයක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අහන්නේ දෙවැනි කාරණයට. සජිත් ප්‍රේමදාස මහත්තයාට ඡන්දය දුන්නද, නැද්ද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් කිවුවේ දුන්නයි කියන එක. ඒක තේරෙන්නේ නැද්ද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කිවුවේ මෛත්‍රීපාල සිරිසේන මහත්තයාට දුන්නේ නැහැ කියලනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් කිවුවේ. සිංහල තේරෙන්නේ නැහැනේ. හරි අප්‍රබංශයක් මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දුන්නා. ඉන්න තැනට දෙන හින්දා දුන්නා. නැත්නම් දන්නවා මොකෙක්ද මේ වසලයා කියලා. එහෙමම තමයි කියන්න ඕන. ඒකේ කතාවක් නැහැ. ඊළඟට වැඩක් තියෙනවා මම මේ කියාස් මන්ත්‍රීතුමා එක්ක පෞද්ගලිකව තරහකට නෙමෙයි කරන්නේ. මේ රටේ මොකක් හරි නීතියක් තියෙනවානේ. මැතිවරණයකට ඉදිරිපත් වෙන කොට බොහොම පැහැදිලි ගැසට් නිවේදනයක් තියෙනවා. ඒ ගැසට් නිවේදනයේ තියෙනවා බොහොම පැහැදිලිව විධායක ශ්‍රේණියේ එක්කෙනෙක් ඡන්දය ඉල්ලනවා නම් එයා ඉල්ලා අස්වෙන්න ඕන කියලා. සභාපතිතුමත් වැටෙන්නේ විධායක ගණයට. ආචාර්ය රිචඩ් පතිරණ හිටපු ගරු ඇමතිතුමාට ඒ ප්‍රශ්නය තමයි එදා බලපෑවේ. එදා මම වගඋත්තරකාරයෙක්. එතකොට වැඩේ තියෙන්නේ ඔබතුමා කියන්න මේ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් ඉල්ලන්නේ. සභාපතිතුමත් ඉල්ලනවා නම් මේ ප්‍රශ්නය තියෙනවා. මේ ප්‍රශ්නය තියෙනවා අනෙක් තැන්වලත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කොහොමත් අයින් වෙලානේ ඉල්ලුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වෙලාවට ඉල්ලා අස් වෙන්න ඕන. වෙලාවට පස්සේ ඉල්ලා අස්වෙලා වැඩක් නැහැ. එතකොට ගරු සභාපතිතුමා පක්ෂයක් නාම යෝජනා භාර දෙන කොට කියන්න ඕන මේකෙන් ඉල්ලලා අස්වෙන්න කියලා. මන්ත්‍රීවරයෙක් වෙන කොට අස්වෙලා ඕන ඡන්දය ඉල්ලන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** නිවාඩු අරගෙන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔව් නිවාඩු අරගෙන. අස්වෙලා නෙමෙයි. ඉතිං ඒක කෙරුණේ නැහැ. ඒක වැරැද්දක්. දැන් මම ඉන්නේ එක්සත් ජාතික පක්ෂයේ නිසා මම ඒක කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම පොඩි දෙයක් අහන්නද කමක් නැත්නම්. චුට්ට් දෙයක් අහන්නේ. එතුමා මම දන්න විදියට මේ ප්‍රාදේශීය සභාවට ආපු දවසේ ඉඳන් හැම ප්‍රශ්නයකටම ඔබතුමත් එක්ක හිටියා. දැන් ඔබතුමා ඒක දැනගෙන හිටියා නම් ඔබතුමා කියාස් මන්ත්‍රීතුමාගෙන් ඇහුවද, ඔබතුමා නිවාඩු ගත්තද, මොකක්ද කියලා. ඔබතුමා ඇහුවද එතුමාගෙන්. ඔබතුමා හැමදාම කරේ ඇම දාලා කාපන් කියලා බලන් ඉඳලා ඊට පස්සේ ෂොට් එක දෙන එක. ඔබතුමාගේ ක්‍රමය ඒකයි අබේසේකර මන්ත්‍රීතුමා. ඔබතුමා සහෝදරයෙක් විදියට එතුමාගෙන් ඇහුවද, ඔන්න ඇත්ත.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් හරිනේ. මට ඒකට උත්තර දෙන්න අවස්ථාවක් දෙන්න. බොහොම පැහැදිලිව මේ සභාවේ වැරදි වෙන කොට අපි කතා කරලා තියෙනවා. වැරදි නිවැරදි කර ගත්තේ නැහැ. දැන් අපි ඒක කරන්න දීලා තමයි කරන්නේ. මොකද හේතුව ඒ තරම් පණ්ඩිතයොනේ ඉන්නේ. ඒක හින්දා කාල ඉවර වුණාට පස්සේ කරනවා. ඒක තමයි ඇත්ත. ඒක මම බොහොම පැහැදිලිව කියනවා. දන්න පණ්ඩිතයෝ කිවුවෙත් නැහැ මේකේ ඉන්න. මේ නොමිනේෂන් ගන්න කොට ඒ පණ්ඩිතයෝ කිවුවෙත් නැහැ. ඒක මම කියන්නේ නැහැ. ඒක මම වුවමනාවෙන්ම තමයි කරේ. ඒක තමයි ඒකට උත්තරය. හරිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තටම මම දන්නේ නැහැ. මට ඒ පිළිබඳව පොඩි දෙයක් කියන්න ඕන. ඔය අබේසේකර මන්ත්‍රීතුමා කියන දේවල් අහන, එතුමත් සමඟ එක මතයේ ඉන්න සියලුදෙනාටම ඒක හොඳ පාඩමක් කියන එක මම සියලුදෙනාටම මතක් කරන්න ඕන. කාටත් ඔය දේ තමයි වෙන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් හැටියට අපි මේ අවස්ථාවේ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව කුමන මත ගැටුම් තිබුණත් මම හිතන්නේ මේ අවස්ථාවේ පාර්ලිමේන්තුව සඳහා ඉල්ලුම් කරන අපේ කියාස් මන්ත්‍රීතුමාටත්, ශ්‍යාමිකා මන්ත්‍රීතුමියගේ ස්වාමිපුරුෂයා වන රන්දික මහත්මයාටත් සුභාශිංසන ගෙන එනවා මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුව නියෝජනය කරන්න වරම් ලැබේවා කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කරාපිටිය කොට්ඨාශයේ උදුල මන්ත්‍රීතුමා කතා කරා වගේ අපේ සභාවේ විපක්ෂ නායකතුමාටයි, ශ්‍යාමිකා මන්ත්‍රීතුමියගේ මහත්මයාටයි මම සුභ පැතුම් එක්කරනවා. මම සුභ පැතුම් එක්කරාට ඒ දෙපළම පරද්දන්නත් කටයුතු කරනවා. අපේ නායකයා වශයෙන් ඉන්නේ රමේෂ් පතිරණ මැතිතුමා. එතුමාට මේ ආසනයේ වැටෙන සියලුම ඡන්ද අරගෙන දෙන්න මම කටයුතු කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මගේ කොට්ඨාශයේ ලී කැටයම් කර්මාන්තය කරගෙන යන අය ඉන්නේ. මම වැඩි හරියක් නියෝජනය කරන්නේ සංචාරක ක්ෂේත්‍රයට ලී කැටයම් කපන වෘත්තිකයන්. ඒවා වැඩි වශයෙන් අලෙවි කරන්නේ සංචාරකයන්ට. ඉතිං මේ අවස්ථාවේ සංචාරකයෝ නැති හින්දා බොහොම අසරණ තත්ත්වයෙන් මේ අය ඉන්නේ. ඒ අයට මේ තත්ත්වය නිසා කිසිම හවුහරණක් නැතුව බොහොම අසරණව ජීවත් වෙන්නේ. ඒ කියන්නේ කුලී වැඩක්වත් මේ අවස්ථාවේ හොයා ගන්න හැකියාව නැහැ. අපි වැඩියෙන්ම භාණ්ඩ සපයන්නේ ලක්සලට. ඒකට මම බැගෑපත්ව ඉල්ලනවා ඔබතුමා දන්වලා යවන්න රාජ්‍ය ආයතනයක් වන ලක්සලට භාණ්ඩ පොඩි වශයෙන් හරි මිලදී ගැනීම සඳහා කටයුතු කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාව මැදිහත්වෙලා කාටද ලිපිය යවන්න ඕන කියලා දැනුවත් කරන්න. අපි ඒ අනුව මගේ අත්සනින් අදාළ ආයතන වලට යවන්නම්.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි සභාපතිතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දැන් කියාස් මන්ත්‍රීතුමා ගැන කතා කරලා මෙතුමා විස්තර වගයක් ඉල්ලපු එක සම්බන්ධව කතා වෙච්ච නිසා මම කියන්නේ. සාමාන්‍යයෙන් මැතිවරණයකට තරගවදින කොට නොමිනේෂන් භාරදීමට දින හතකට කලින් නිවාඩු අනුමත කර ගන්න ඕන අදාළ ආයතනවලින් හරි පක්ෂවලින් හරි. එතකොට දීමනා ගන්න බැහැ නොමිනේෂන් භාර දුන්නට පස්සේ. මම දන්නේ නැහැ මෙතුමා මොන හේතුවක් උඩ ඉල්ලනවද කියලා. නොදන්නාකමට එතුමා අරගත්තද දන්නේ නැහැ මේතාක් දුරට. මම දන්නේ නැහැ ගත්තද, නැද්ද කියන්න. මෙතුමාගේ යාළුවෙක් විදියට යමක් දන්නවා නම් තමන්ගේ සගයෙකුට ඒක දැනුවත් කරන්න ඕන බං, මචං, හරි කියලා මෙහෙම දෙයක් තියෙනවා කියලා. මේවා යන්න ඕන ප්‍රොසීඩියර්

එක එහෙමයි. මගේ නම් විරුද්ධ පක්ෂයේ වුණත්, ජනතා විමුක්ති පෙරමුණේ වුණත් කවුද කියලා නැහැ ඇහුවානම් යමක් දන්නවා නම් කියනවා. ආයතන සංග්‍රහයේ 33 I වගන්තිය යටතේ ඔය සියල්ල තියෙනවා. ආයතන සංග්‍රහය මම බොහොම හොඳින් දන්නවා. චක්‍රලේඛන ගැනත් දන්නවා. ඒක නිසා යමක් දන්න නිසා මම නම් නොදන්න කෙනෙකුට ඒක කියලා දෙනවා. නිවාඩු සම්බන්ධව මම මෙතුමියට කියලා දුන්නා. ඒකයි වෙන්න ඕන. මෙතනට ආවම අපි සහෝදරයෝ. මතවාද, ගැටීම් තියෙන්න ඕන. නැත්නම් මේකේ දේශපාලනයක් කරන්න බැහැ ඒකපාර්ශවික වෙන නිසා. මම හිතනවා අබේසේකර මන්ත්‍රීතුමා මේ කතාව අහලා, මේ කතාවෙන් පස්සේ ඔබතුමා අදහස් කියන්න. නමුත් සභාපතිතුමා ඉන්න තැන මම ඉන්නවා. නමුත් මේ වෙලාවේ එතුමාට හානියක් කරන්න එපා මොන පක්ෂයේ වුණත් කමක් නැහැ. මහා කැපවීමක් කරලා එතුමා ඒ ජයග්‍රහණය ලබා ගන්න යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම එකක් තියෙනවා. රජයේ සේවකයෙක් මැතිවරණයට ඉදිරිපත් වෙන කොට ඒ අය මේක දන්නවා. නමුත් මේක සුවිශේෂී අවස්ථාවක් නේ. මේක ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් වෙන අවස්ථාවක්. දීමනාවක් ලබන කෙනෙක් නිසා ඉතිං ඒකේදී ඒ අවබෝධය පිළිබඳ පොඩි ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒකයි මේකයි ගලපන්න එපා. ඒකයි මම මෙතුමට කියන්නේ. මේවා ඉල්ලලා එහෙම හානියක් කරන්න එපා. මම කියනවා ඔබතුමාට සභාවක් විදියට සභාවේ කතා වෙච්ච නිසා එම ඉල්ලීමට අනුකූලතාවයක් දක්වන්න එපා කියලා මම යෝජනාවක් කරනවා. ඒක ස්ථිර කරනවා නම් මේ මන්ත්‍රීවරු කරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දෙන්නේ නැහැ සභාවේ සභාපතිවරයා විදියට. නමුත් මෙතුමා තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලලා තියෙන්නේ. එතකොට දෙන්න වෙනවා. ඒකයි. මෙතුමා තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉල්ලලා තියෙනවා අදාළ තොරතුරු. අපි ඒක සති දෙකක් ඇතුළත එතුමාට ලබා දෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මැතිවරණයක් කරන්නේ මහා කැපවීමක් කරලා. පහර ගහලා ඒක කිලිටි කරන්න එපා. එතුමත් එක්ක ඔබතුමාගේ ගණුදෙනුවක් තියෙනවා නම් ඒක සුහදව බේර ගන්න. අනිත් කවුරුවත් මම හිතන්නේ ඒ ගණයට වැටෙන එකක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමත් ඒ කාරණයට නම් මම එකඟ නැහැ. ඒකත් මම මේ අවස්ථාවේදී කියන්න ඕන. නමුත් එතුමා පුද්ගලිකව තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉල්ලලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ආයතන සංග්‍රහය පිළිබඳව අපිත් දන්නවා. මොකක් හරි එහෙම ගැටලුවක් තියෙනවා නම් ඕන වෙලාවක අපි ඉන්නවා. ආයතන සංග්‍රහයත් ඕන කෙනෙකුට ලබා දෙන්න කටයුතු කරනවා. හානි කරන්න ලෑස්ති වෙන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මෙතුමම කියනවා ඕන කෙනෙකුට තමන්ගේ දේශපාලන මතය දරන්න පුළුවන් කියලා. නමුත් එතුමා එක්සත් ජාතික පක්ෂය යටතේ මන්ත්‍රීධූරයට ආවේ. වර්තමානයේ ඒ පක්ෂය ඇතුලේ අර්බුදයක් තියෙනවා. දැන් කණ්ඩායම් දෙකක් බෙදිලා තියෙනවා. එතුමාටත් අයිතිය තියෙනවා එතුමාගේ මතය නියෝජනය කරන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ අදහස කොයිතාක් දුරට සාධාරණද දන්නේ නැහැ. කියාස් මන්ත්‍රීතුමා දැන් අපේක්ෂකයෙක් විදියට ඉදිරිපත් වෙලා තියෙනවා. තොරතුරු දැන ගැනීමේ පනතින් අපේක්ෂකයෙක් ගැන තොරතුරු ලබා දීම පිළිබඳව මැතිවරණ කොමසාරිස්තුමාගෙන් විමසීමක් කරලා තොරතුරු ලබා දීම කරන්න පුළුවන් නම් වඩාත් හොඳයි එතුමා මැතිවරණ අපේක්ෂකයෙක් නිසා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා, අපේ පක්ෂය වෙනුවෙන් කියාස් මන්ත්‍රීතුමාට අපි ඇත්තටම සුභ පතනවා. අපි දන්නේ නැහැ මෙතන මොන මොන මතවාද තියෙනවාද කියලා. අපේ නම් කිසිම මතයක් නැහැ. අපි කාටත් එකයි. එක එක්කෙනාගේ මත මේවා. ඉතිං පක්ෂය දෙකට වෙන් වෙලා තියෙන අවස්ථාවක එක එක්කෙනාගේ ප්‍රශ්න විවිධාකාරයි. අපි නම් කියාස් මන්ත්‍රීතුමාට උපරිමයෙන් සහයෝගය දෙනවා. අපි ඇත්තටම සතුටු වෙනවා ප්‍රාදේශීය සභාවක් විදියට ප්‍රාදේශීය සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුවට ඉල්ලන එක ගැන. ඉතිං තම තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථාව තියෙනවා. ඒකට අපිට විරුද්ධ වෙන්න බැහැ. අපි තවදුරටත් සුභ පතනවා කියාස් මන්ත්‍රීතුමාට.

රංගනී මන්ත්‍රීතුමියගේ මව අසනීප වීම හේතුවෙන් එතුමියට සභාවට සහභාගි වෙන්න නොහැකි නිසා එතුමියට නිවාඩු අනුමත කරන්න මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**(උ෧) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ජුනි මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපේ ගයාන් ගීතික මන්ත්‍රීතුමාගේ දැනුම් දීමට අනුව හොයලා බැලුවම කිවුවා ජස්ටින් කන්දේ ගෙවල් තුනකට විතර වතුර අඩුපාඩුවක් තියෙනවා කියලා. ඒකට හේතුව වෙලා තියෙන්නේ කහඳූව වත්ත හන්දියේ තියෙන පාලමේ නල මාර්ගය අයින් කරලා තිබීම. ඒ නල මාර්ගය අයින් කරපු එකට කොලම්ස් වගයක් ගහන්න තියෙනවා. ඒ කොලම් ටික ගහලා තියෙනවා ඊයේ. ඒ කියන්නේ හෙට වෙනකොට වැඩේ අවසන් කරන්න පුළුවන් කිවුවා. අද හවස තුන වෙනකොට වතුර ලබා දෙන්න කටයුතු කරනවා කිවුවා. පම්ප් එකෙනුත් ඉතුරු ගෙවල් වලට වතුර ගහනවා කිවුවා. ගෙවල් තුනක විතරක් ප්‍රශ්නයක් තියෙනවා කිවුවා. අද හවස තුනට වතුර දුන්නම හරි යයි කිවුවා. අරක තමයි ප්‍රශ්නය. පාලමේ නල මාර්ගයේ ප්‍රශ්නය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** විකල්ප ක්‍රමයක් හදලා ජනතාව දැනුවත් කරන්න ඕන. බටය ගලවලා දාලා වතුර නෑ කියන එක නෙමෙයි කරන්න ඕන. වතුර බවුසරයක් යවන්න ඕන එක්කෝ. දවස් පහකින් වතුර නැහැ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ගල්කැටිය වත්තේ මාර්ගය හා කාණු පද්ධතිය සම්බන්ධව ප්‍රශ්නයක් තිබුණා පහුගිය දවස්වල. ඔබතුමා ගිහින් බැලුවා. ඒකට මොකද වුණේ කියලා දැන ගන්න කැමතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද,

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගල්කැටිය වත්තේ ඇතුල් වෙන කොට තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංස්කෘතික මධ්‍යස්ථානය ඉස්සරහද,

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඔව්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මම අදාළ සියලුදෙනා එක්ක සාකච්ඡා කරලා තියෙනවා. සියලුදෙනාගේම එකඟතාවයෙන් එහා පැත්තේ කොනේ ඉඳන් ඇවිල්ලා පාර අඩි දොළහට බඳාදා බැකෝ එක දාලා කපා ගෙන ආවා. ඉතුරු ටික කරගෙන ආවට පස්සේ අර අය එකඟ වුණා ඒ අයගේ තාප්පය කඩලා අඩි දොළහ ප්‍රමාණය ලබා දෙන්න. ඒ අය කියනවා මුලින් අඩි හතරයි තිබුණේ, ඊට පස්සේ අඩි අටක් වෙනකම් දුන්නා දැන් අඩි දොළහක් වෙනකම්ම ඉල්ලනවා කියලා. මගෙන් ලිපියක් ඉල්ලුවා. මගෙන් පස්සේ නැවත ඉල්ලයි කියලා. මම ලිපියක් දෙන්නම් කියලා එකඟ වුණා. අඩි දොළහේ ප්‍රමාණය ලබා දෙන්න එතන බැම්ම ගහලා ඒ වැඩේ අවසන් කරන්න කියලා ඒ තීරණයට තමයි ආවේ. සියලුදෙනා එකඟයි ඒ කාරණයට.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, පොඩි කාරණයක් තියෙනවා ඔබතුමාගේ අවධානය යොමු කරවන්න. අපේ ගම්වල පර්චස් හතේ, අටේ ප්‍රමාණවල නිවාස තනාගෙන තියෙනවා. ඒ නිවාස වල වැසිකිලිවලවල් අල්ලපු නිවසේ ළිඳ ආසන්නයේ නිසා ලොකු ගැටළුවක් තියෙනවා. ඒ නිසා මේකට ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. ටැංකි ක්‍රමයක් තියෙනවා වළලන. ඒ ටැංකියේ ප්‍රමිතිය එච්චර හොඳ නැහැ. ඒක ප්‍රමිතියක් නැති මට්ටමක් තමයි සඳහන් කරන්නේ. මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ටත් කතා කරා. අඩු ගානේ තාක්ෂණික දැනුමවත් අපිට දෙනවා නම් ටැංකිය මේ මේ ප්‍රමිතියට සකස් කරන්න කියලා එතකොට ඒ මිනිස්සුන්ට ඒ ගැටළුව නිරාකරණය කර ගන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒක මෙහෙම කරමු. අපි ඒක ටයිප් කරලා අනුමත කරන හැම බිල්ඩින් ඇප්ලිකේෂන් එකක් එක්කම ලබා දෙන්න කටයුතු කරමු. ඒකේ අවශ්‍ය සනකම ඒ විස්තර ටික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි එක්කත් කතා කරලා දෙමු. හැබැයි අනුමත කරන්නේ නැති ඒවාට තමයි ප්‍රශ්නය තියෙන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා :-** අන්න ඒක තමයි සභාපතිතුමා ප්‍රශ්නය තියෙන්නේ. අනුමත නොකරපු ඉඩම් කැබලිවල ඉන්න මිනිස්සුන්ට ඒක අසාධාරණයි නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අපි ඒ විදියට කරලා සැලසුම ලබා දෙන්නම්. අපි ඒ විදියට හදාගන්න කියමු.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා :-** ඉඩම් කැබැල්ල හා බිල්ඩින් එක අනුමත කිරීමට පෙර සිදුවීමක් කරලා තිබුණා නම් ඒක ගැටළුවක් වෙන්නේ නැද්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒක ගැටළුවක් වෙන්නේ නැහැ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා :-** ඊළඟට ගරු සභාපතිතුමනි, කුරුන්ද කන්දේ සොහොන් පිටියේ මැද පාරට ඔබතුමා ගිය වතාවේ කිව්වා පොලීසියේ පැමිණිල්ලක් දාලා වහාම ඒ පාර වහන්න කියලා. තව වෙනතුරු ඒ දේ සිද්ධ වුණේ නැහැ ගරු සභාපතිතුමනි. අපේ සභාව සතු දේපළක් සොහොන් පිටිය. සභාවෙන් එක පුද්ගලයෙකුට එහෙම කරන්න දෙන්න බැහැනේ. කරන්න පුළුවන් කමක් නැහැනේ. පොලීසියේ පැමිණිල්ලක් දාලා පොලිස් නිලධාරීන් කැඳවලා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒකට පොලීසියේ සහයෝගය ඇතුව කරන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා :-** ලබන සභාවට ඉස්සෙල්ලා ගරු සභාපතිතුමනි ඒක කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** පොලීසියේ සහයෝගය ඇතුව සම්පූර්ණයෙන්ම වැට ගහලා අපි ඒ දේපළ වෙන් කර ගන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා :-** එක පුද්ගලයෙක් පාවිච්චි කරන්නේ ඒ පාර.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මැනුමක් කරන්න ඕන නැහැ. මායිම් තියෙනවානේ. එතනින් පාරක් පාවිච්චි කිරීමනේ ප්‍රශ්නය තියෙන්නේ. අපේ භූමිය ඒක. සුසාන භූමියක් හින්දා අපිට බලය තියෙනවා. ඒක සති දෙකක් ඇතුළත ඔබතුමා බලලා කරන්න. මතක තියා ගන්න ඒක සති දෙකක් ඇතුළත ඉවර කරන්න.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා :-** ඊළඟට සභාපතිතුමනි, කපුහෙම්පල සායන ගොඩනැගිල්ලේ වතුර ටැංකිය සවිකරා. නාමපුවරුවත් සවිකරා. ඒකට ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා. ඊළඟට මගේ දිනයට ගරු සභාපතිතුමනි කම්කරුවන් එන්නේ බොහොම සීමිත ප්‍රමාණයක්. කපුහෙම්පල හිටපු ප්‍රාදේශීය ලේකම්තුමාගේ ගෙවල් පාරට සිලින්ඩර් දාලා තියෙන ගැටළුව නිරාකරණය කරලා දෙන්න කියලා ඉල්ලීම් ආවා. ගරු ඇමතිතුමත් මට කතා කරලා කිව්වා ඉක්මනින් සිලින්ඩර් දාලා මේ ගැටළුව නිරාකරණය කරලා දෙන්න කියලා. කැටගල් පාරක් තියෙන්නේ. කැටගල් ගලවලා ඉවත් කරොත් එතන නැවත කොන්ක්‍රීට් කරන්න වෙනවා. නැත්නම් කැටගල් ඉහිරිලා යනවා. ඒකට මොකක්ද ගරු සභාපතිතුමනි කරන්න පුළුවන්. ප්‍රීමික්ස් යාඩ් එකත් වැඩ කරන්නේ නැහැනේ මේ දවස්වල.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** වැඩ කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා :-** කවදද, දැන් යනවාද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** වතුරවලට කඩන ඒවා දැම්මේ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා :-** වතුරවලට කඩන ඒවාට වෝටර්බෝඩ් එකෙන් ගෙවලා නෙමෙයිනේ හදන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** නෑ මිනිස්සු ගෙවපුවා තියෙනවානේ. පාර කඩනවාට මිනිස්සු අපිට ගෙවනවානේ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා :-** වතුරවලට කඩපුවට දාන්න දෙන්න මටත්. හරි කමක් නෑ බොහොම ස්තුතියි. මට ඉදිරියේදී දවසක්, දෙකක් දෙන්න එහෙමනම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, ඔබතුමාට ගිය සභා වාරයේදී බොහොම පැහැදිලිව කිව්වා අර තරංගා ලැන්ඩ් සේල් කරපු එකේ ෆයිල් එක ගෙන්න ගන්න කියලා.

යූ. ඩී. එකේ තියෙන්නේ. යූ.ඩී. එකෙන් අනුමැතිය දුන්නේ. වතුර ටැංකිය පාරේ එක. ඒකට තව වෙනකම් ක්‍රියාත්මක වෙලා නැහැ. ඒක ඔබතුමාට බලපාන ප්‍රශ්නයක් නෙමෙයිද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපේ දේපළක්නේ. පිටපත් ගෙන්න ගන්න. අපි ඒකට වගකියන්න ඕනනේ. එකේ පිටපත් දෙන්න කියන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අඩු තරමේ මේ දවස් දෙක තුනේවත් ගෙන්න ගන්නකෝ. කිය කිය හිටියට ගෙන්න ගන්නේ නැහැනේ.

ඊළඟට ගරු සභාපතිතුමනි, දිගින් දිගට කියලා වැඩක් නෑ අනවසර ඉදිකිරීම් හා ගොඩකිරීම් පිළිබඳව. මේකට ගන්න පියවරක් මේ මාසේවත් ප්‍රධාන දේවල් වලට.

ඊළඟට ඔබතුමා හරි දෙයක් කරලා තියෙනවා. ඉඩම් වෙන්දේසි කිරීම පිළිබඳව දැනුවත් කරලා තියෙනවා. හැබැයි මේකේ වැරදි විදියට වෙලා තියෙන්නේ. ඒ කියන්නේ දැන් ඒක වෙන්දේසි කරනවා. දැන් අරගෙ කපනවා, කොටනවා, අද දවසෙත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහේද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වටරැක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නවත්වලා තියෙන්නේ අපි ටෙලිග්‍රෑම් පවා ගහලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නවත්වලා නෙමෙයි අද දවසෙත් මේවා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් යැවුවා මම. මේ දැන් යැවුවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අර කිරා ඉඳගෙන කියනවා ඔබතුමා මේකට අතදාන්න එපා මෙහෙමයි කියලා කියනවා. ඒ අය තදින් විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවදද කිරි මල්ලි කිවුවේ මට අත දාන්න එපා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා එතනට ගිහිල්ලා කිවුවද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම එතනට අද වෙනකම් ගිහිල්ලා නෑ අබේසේකර මන්ත්‍රීතුමා. කිරි මල්ලි අද උදේ කතා කරලා විස්තර ගොඩක් කිවුවා හැබැයි. මම ගියේ නෑ. මට දුරකථන ඇමතුමක් දුන්නා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි කිරි මල්ලිට කිවුවා දැන් ඔයා මෙතනට ඇවිල්ලා ඔය දේ කියන්න කියලා. අපි බොහොම පැහැදිලිව කිවුවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඊයේ මෙතනට ඇවිත් අපි එක්කත් කිවුවා තහනම් කරන්න කියලා. සුගත් අයියාගෙන් අහන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් අයියාගේ ඉඩමක් ඕකේ කොහෙද තියෙන්නේ. අයිතිවාසිකමුත් කියාගෙන එනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් සභාපතිතුමා මෙහෙම තියෙන්නේ. මේ විදියට කරනවා කියලා වහාම බැනර් එකක් දම්මලා නතර කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාව දන්නේ නැතුව නෙමෙයි මන්ත්‍රීතුමා. මාස හයක් වෙනවා ඒ ගොල්ලෝ අපිට දීලා. මාස තුනක් කොරෝනා නිසා කල් ගියා. අපි නවත්වලා තියෙන්නේ. කොන්දේසි දීලා තියෙන්නේ. වටමැනුම අනුමත කරලා තියෙන්නේ. ඉතුරු ඒවා නැවැත්තුවා. ටෙලිග්‍රෑම් ගහලා අපි නවත්වලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක හරි නවත්වලා නම්. දැන් සභාපතිතුමා අපි දා ගත්තා පොඩි මේවා එකක් ඔබතුමන්ලා අපි යමු කියලා අර ෆයිල් ටික ගේන්න කියලා අවුරුදු පහ ඉවර නොවුන පාරවල් ටික හදන්න. චාර්ටඩ් ඉංජිනියර් දෙන වාර්තාව නම් අමු කුණුහරුපයක්නේ. ඒක වැඩක් නැහැ. ඒක තේරුමක් ඇති එකක් නෙමෙයි. දැන් මම ගියපාරත් කිවුවා. අර උළුවිටිකේ කඩා ගෙන ගිය වාහනවලටත් හානි වුණ එකේ ෆයිල් එක ඉදිරිපත් කරන්න කියලා පොඩ්ඩක්. ඉතිං

ඒක අනුමත කරලද නැද්ද කියලා බලන්න ඕන. ඉතිං සභාපතිතුමනි දිගින් දිගටම මේවා වෙන්නේ ක්‍රමයකට වැඩක් නැති වුණාම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං මම කිවුවානේ අබේසේකර මන්ත්‍රීතුමා ඒ ෆයිල් ඕන වෙලාවක ලේකම්තුමා ළඟට ගිහිල්ලා බලන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. ඒක මම කාටවත් වළක්වලා නැහැ. ඕන කෙනෙකුට බලන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එදා ඒක තිබුණේ නැහැ. අනිත් එක තිබුණා. ඒක බලලා ගියේ. ඉතිං ගරු සභාපතිතුමා මම කියන්නේ මේ ටික කරනවා නම් මම හිතන්නේ හොඳයි.

දැන් අපි අද කියනවා අර කතා කරන්න අවස්ථාව හම්බවුණේ නැති මන්ත්‍රීවරුන්ට අපි යන්නේ නැහැ ඕන තරම් කතා කරන්න අපි අහගෙන ඉන්නම් කියලා. දැන්වත් කටහඬ අහන්න ආසයි කතා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වගේම මට පොඩි දෙයක් කියන්න ඕන. අපේ අලුතෙන් ආපු කම්කරුවන් පිළිබඳව මගේ කිසිම ප්‍රසාදයක් නැහැ. ඒක කියන්න ඕන. ඒ එවපු මන්ත්‍රීවරුන්ටත් වගකීමක් තියෙනවා තමන් එවපු සේවකයා පිළිබඳව. ඇත්තටම මට නම් කිසිම පැහැදීමක් නැහැ. බොරු කියන්න ඕන නැහැ. දැන් පැමිණීම 50% ක් වත් නැහැ. මේක මට නම් ඇත්තටම එපාම වෙලා තියෙන්නේ. මම ඒ දහදෙනා අවුරුද්දෙන් එහාට තියා ගන්නවද, නැද්ද කියලා තීරණය කරගන්න බැරුව ඉන්නේ. මොකද හේතුව සභාවට එනවා පෙරවරු 11.00 වෙද්දි. පෙරවරු 09.00 පහුවෙලා මෙතනින් ගිහිල්ලා සභාවට පෙරවරු 11.00 වෙද්දි එනවා. මගේ ඇස් දෙකට දැකලා තියෙනවා. ඒ පැය දෙකවත් වැඩ කරනවාද අඩුම ගාණේ. ඔහොම තත්ත්වයක් තියෙන්නේ. මම කණගාටු වෙනවා. තමන් දැම්මේ වැඩ කරන්නනේ. කරුණාකරලා මම අදාළ මන්ත්‍රීවරුන්ට කියනවා තමන් දාපු අයට කියන්න අඩුම තරමේ තමන් ගන්න දීමනාවටවත් මෙතන වැඩ කරන්න කියලා. කවුරුවත් මුකුත් කියන්න එපා. මම අනිවාර්යයෙන්ම බලලා අයින් කරලා දානවා දහ දෙනාවම. ඒක අනිවාර්යයෙන්ම කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉස්සෙල්ලා ලියුමක් දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. ලියුමක් දාන්න අවශ්‍ය නෑ අබේසේකර මන්ත්‍රීතුමා. අවුරුද්දකට බඳවාගෙන තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** ඒ කම්කරුවන් ගැන අපි කතා කරන්න ඕන. සාධාරණයි සභාපතිතුමාගේ කතාව. හැබැයි එහෙම නම් මෙහෙම දේකුත් තියෙනවා. ඒ අයගෙන් වැඩ ගන්න අපි දැන ගන්නත් ඕන. අපි කියන දේ අහන විදියට හදා ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැමෝම ගැනමත් නෙමෙයි. එහෙම දේකුත් තියෙනවා සුගත් මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** හැමදෙනාම එක විදියට ඉන්නත් ඕන. හැබැයි එතකොට අපේ වැඩ පරීක්ෂක මහත්මයා දැන ගන්න ඕන ඒ අනුව ක්‍රියාත්මක කරන්න. වෙනදා කෙරිච්ච විදියක් තිබුණානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මෙහෙමනේ මන්ත්‍රීතුමා. දැන් කොට්ඨාශයේ මන්ත්‍රීවරයට ලයිට් ටික දෙනවා. කම්කරුවෝ දෙනවා. තමන් දන්නවානේ මගේ කොට්ඨාශයේ අද වැඩ කරනවා කියලා. ඉතිං තමනුත් වැඩගන්නේ නැහැනේ. ඒකනේ වෙලා තියෙන්නේ. මම කියන්නේ ඔබතුමා ගැන නෙමෙයි. තමනුත් දැන ගන්න ඕන ඒ අයට කියලා වැඩ ගන්න. ඒ අය කියන්නෙත් නැහැ. ඔයගොල්ලෝ කැමති වෙලාවට යන්න කියලා කියන්නේ. ඒක මම මෙතන කියන කොට "උෟ සභාපතිනේ, උෟට ඕන විදියට වැඩ කරන්න ඕන නෑ අපි බලාගන්නම් කියනවා". ඕකනේ ඇත්ත කතාව. ඒක හින්දා තමන්ටත් වගකීමක් තියෙනවානේ. තමන්ගේ කොට්ඨාශයට වැඩ කරන්න දාන අයගෙන් අඩුම ගණනේ ප.ව 04.30 වෙනකම් නෙමෙයි ප.ව 03.00 වෙනකම්වත් වැඩක් ගන්න. පෙ.ව 11.00 වෙනකොට මෙතනට එනවා. උදේ 9.00 ට ගිහිල්ලා පෙ.ව 11.00 ට මෙතනට එනවා කියන්නේ මොකක්ද තත්ත්වය. ඒ වැඩේ ඉවරනම් වෙන වැඩකට දාන්න ඕන.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** එතනදී සභාපතිතුමා මට කියන්න දෙයක් තියෙනවා. මේ සභාව පටන් ගතිපු කාලයේ ඉඳන් අද වෙනකම් මගේ ප්‍රදේශයේ ගිහිල්ලා වැඩ කරපු එක අඩුවට කරේ නැහැ. ඒ අය ඒ කියපු ප්‍රමාණය කරනවා. මේ පාරත් හතරදෙනයි යැව්වේ. ඒ හතරදෙනා මම කියපු කාණුව පහළ පැත්තත් සුද්ධ කරලා උඩ පැත්තත් සුද්ධ කරලා තිබුණා. මම ඒ පැත්ත

පළාතකවත් ගියේ නෑ හැබැයි. මට මේ පාර නම් යන්න බැරි වුණා. නමුත් මම ඊට පස්සේ ගිහිල්ලා බැලුවා. කරලා තියෙනවා. ඒ චෝදනාව මට වැඩ කරන මිනිස්සුන්ගෙන් ගන්න බැහැ. හේතුව ඒ අය අධෛර්යමත් වෙනවා. මට මේ මිනිස්සු වැඩ කරනවා නම් මමත් ඒ මතයේ ඉඳන් කතා කරනවා නම් වැඩ කරන්නේ නැහැ කියලා එතකොට ඒ මිනිස්සු අපිත් එක්ක අමනාප වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සියලුදෙනා ගැන නෙමෙයි මම කියන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** ඒක තමයි මම කියන්නේ. අපිත් මන්ත්‍රීවරු වශයෙන් දැන ගන්න ඕන ඒ කාර්යය ඉෂ්ට කරවා ගන්න. එතකොට මේ ප්‍රශ්නය ඇති වෙන්නේ නැහැ.

ඒ අතරම මම මතක් කරනවා අපේ හිටපු සභාපතිහිමි උක්වත්තේ චන්දිම හාමුදුරුවන්ගේ දානමය පිංකමක් තියෙනවා 26 වෙනිදා. ඒකට වතුර බවුසරයක් ඉල්ලලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉල්ලීමක් කරන්න කියන්න ලිඛිතව.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** ඒකත් මම මතක් කරනවා සභාවේදී. නැත්නම් අපි කතා නොකරයි කියලා කියාවි හාමුදුරුවෝ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, ඔය සිද්ධිය වුණේ මගේ කොට්ඨාශයේ වැඩ කරන දවසක. එදා දිනයේ තමයි පෙ.ව 11.00 ට ආවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ එක දිනයක් විතරයි මන්ත්‍රීතුමා. ඕක වෙනවා අනන්තවත්. මම දැක්කේ එදා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ටොරින්ටන් එකේ වැඩට දාලා තිබුණා. සම සෞඛ්‍ය විශ්වවිද්‍යාලය අසල කාණුව කපන්නත් දාලා තිබුණා. මට ලොකුම ගැටළුවක් වෙලා තිබුණා වීදි පහන් සම්බන්ධව. වීදි පහන් හතලිහක් විතර අළුත්වැඩියා කරන්න එදා දවසේ තිබුණා. ඒ හින්දා මම ලයිට් වාහනයේ පිටිපස්සෙන් ගියා ඒ ලයිට් හදවගන්න. හවස 04.00 වෙනකොටත් මම ලයිට් වාහනය තියාගෙන ලයිට් හදනවා. මේ අයට මම වැඩේ පවරලා ගිහිල්ලා තිබුණේ. මේ අය ආවා කියලා මට මෙහෙන්ම කතා කරලා කිවුවේ. එතකම් මම දන්නේ නැහැ. හැබැයි ඒ වැඩෙත් කරලා තිබුණා කාණුවේ ප්‍රමාණයක්. හැබැයි ගැටළුව තව ඉදිරියට කාණුව තියෙනවා. මෙහෙනුත් අධීක්ෂණය සිදු වෙනවා කියලා කියනවානේ. මෙහෙන් කවුද බලන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට උත්තරයක් දෙන්නම් ඊළඟ සභාවේදී. මම කියලා තියෙන්නේ කියන්න ඕන විදියට.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ කම්කරුවන් දහදෙනා අපි තාවකාලික පදනමින් බඳවාගෙන තියෙන්නේ කොයිතරම් කාලයකටද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවුරුද්දකට.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එතකොට මේ අයගේ පැමිණීම සේවය ස්ථිර කරන අවස්ථාවේදී අනිවාර්යයෙන්ම බලනවා. දැනට පැමිණීම හුඟක් දුර්වල බව ඔබතුමා ප්‍රකාශ කරා. ඒක අපි දන්නවා. කම්කරුවෝ උදේ සේවයට වාර්තා කරපු ගමන්ම අපි කාටත් අපේ දිනයට කම්කරුවෝ වැඩි පිරිසක් ලැබෙනවා. මේ අයගේ නොපැමිණීම හේතුවෙන් අපිට තුන් හතර දෙනයි ලැබෙන්නේ. අපි හැමෝටම ඒක තමයි ඇත්ත තත්ත්වය උදා වෙලා තියෙන්නේ. මේක නිසා ඔබතුමා ලේකම්තුමා එක්ක කතා කරලා ලේකම්තුමා මගින් ඒ අයගේ පැමිණීම මීට වඩා විධිමත් කර ගන්න. පැමිණීම පිළිබඳව අවවාද කරලා ලිපියක් යොමු කරන්න. නැත්නම් කැඳවපු වෙලාවක දැනුම් දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි කොහොමත් මාසයකට පැමිණීම 50% ට වඩා අඩු අයට ලිඛිතව දැනුවත් කරනවා ඒ අයගේ රැකියාව පිළිබඳව අපි වගකීමක් ගන්නේ නැහැ කියලා.

(ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒක හොඳයි.

ඊළඟට මේ කම්කරුවෝ ඇත්තටම අපි ඉන්නවා නම් ඔවුන් සමඟ වැඩ කරන ස්ථානයේ වැඩ කරනවා. දැන් මම ආරම්භයේ ඉඳන්ම කරන්නේ ඉන්න කම්කරුවෝ ගාණ බලලා මේ පාර මෙච්චර දුරට සුද්ධ කරලා ඕන වෙලාවක යන්න කියලා අවස්ථාවක් දෙනවා. ඔවුන් ඊට පස්සේ එක දිගට වැඩ කරලා මගේ ටාගට් එක ඉවර වුණාම ඒ අය දෙකට හරි එකට හරි එනවා. එහෙම ක්‍රමයක් අපි

හදාගන්න ඕන. ප්‍රමාණය කිවුවම දිගටම වැඩ කරනවා. හොඳ කම්කරු මහත්වරුත් ඉන්නවා. ඒ නිසා පැමිණීම වැඩි කර ගන්න කියලා යෝජනා කරනවා.

ඒ වගේම තවත් යෝජනාවක් ඔබතුමාට ඉදිරිපත් කරන්න කැමතියි. අපේ රත්නගිරි වත්ත, පැලවත්ත සුසාන භූමිය කැලෑව වැවිලා තියෙන්නේ. සුසාන භූමියේ වට අඩි අටක විතර පුළුන් ගහක් තියෙනවා. ඒක තියෙන්නේ මායිමට ආසන්නයේ. ඒකෙන් අසළ නිවැසියන්ගේ නිවෙස්වලට අනතුරුදායක තත්ත්වයක් තියෙනවා. ඒ පුළුන් ගහ කපන්න යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ පුළුන් ගහත්, අපේ රක්ෂිත කොටසේ තියෙන නුග ගසත් හැකි ඉක්මනින් කපා ඉවත් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි බොහොම ස්තුතියි.

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළග මහා සභා රැස්වීම 2020.07.21 වන අඟහරුවාදා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.